පිදුරුවැල්ලෑව එල්ලංගාව කළමනාකරණ පැතිකඩ

හා මූලික සංවර්ධන සැලැස්ම

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය

වයඹ පළාත

පටුන

01.හැඳින්වීම 1

1.1. ප්‍රදේශයේ පවතින එල්ලංගා පිළිබඳ මූලික හැඳින්වීම: 3

1.2. පිදුරුවැල්ලෑව එල්ලංගාව හා එහි පිහිටීම 4

1.3. ග්‍රාමනිලධාරී කොට්ඨාශ මට්ටමින් පිදුරුවැල්ලෑව එල්ලංගාව 8

1.4. පිදුරුවැල්ලෑව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු...10

1.4.1එල්ලංගාවේ වැව් පිළිබඳ තොරතුරු 15

1.4.2.පිදුරුවැල්ලෑව එල්ලංගාව යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් පිළිබඳ විස්තර 17

02.පිදුරුවැල්ලෑව එල්ලංගාව තිරසර ලෙස කලමණාකරනය කිරීමේ වැදගත්කම 19

2.1. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම 21

2.2. එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය 23

2.3. එල්ලංගා පැතිකඩ සකස්කිරීමේ අවශ්‍යතාවය 24

2.4. පිදුරුවැල්ලෑව එල්ලංගා පැතිකඩ සකස්කිරීමේදී භාවිතාකල ක්‍රමවේදය 24

2.5. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කිරීමේ අරමුණු 27

2.6. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම 27

2.7. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය 27

2.8. තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම 28

2.9. පිදුරුවැල්ලෑව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනාගැනීම....................................... 29

03. පිදුරුවැල්ලෑව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ 31

3.1.භූගෝලීය (Geographical) තොරතුරු 31

3.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු.. 31

3.3.ජල විද්‍යාත්මක (Hydrological) තොරතුරු 38

3.4. පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු 41

3.5. එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු................................ 43

3.6. සමාජ ආර්ථික තොරතුරු 43

3.7. එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් (Constructions) කටයුතු පිළිබඳ තොරතුරු

එල්ලංගාව තුල විශේෂ ඉදිකිරීම් දක්නට නැත. පදිංචිය සදහා නිවාස වෙළදාම සඳහා ගොඩනැගිලි සුලු වශයෙන්ද ඉදිවෙමින් පවතී .මීට අමතරව වගාව සඳහා සිදු කෙරෙමින් පවතින විවිධ ඉදිකිරීම් දක්නට ලැබේ. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතල බවට පත්ව ඇත .මේ සඳහා විසඳුමක් වශයෙන් අලිවැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහදරයි. බොහෝ වගා බිම්වල උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත .දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මෙම ප්‍රශ්නය ගැන විශේෂ අවධයානයක් යොමු කරන අතර 2020-2024 කාල සීමාවන් තුලදී අලි වැටවල් ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය සිදුකර ඇත. ඉදිකිරීම් අතරින් මේ දිනවල විශේෂත්වයක් ගන්නේ දේශගුණ සුහුරු වාරි

කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබන වාරිකර්මාන්ත සම්බන්ධයෙනි. කෘෂි ළිං වැව් සොරොව්, කෘෂි ළිං ,කෘෂිමර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය වෙමින් පවති. දැනට එක් ළිදක් පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ එල්ලංගාවට ඉදිකර ඇති අතර නව ළිං ඉදිකිරීමට අපේක්ෂිතය. ප්‍රදේශය පුරා ඇති මුළු කෘෂි ළිං ගණන 67 කි. තවද නිවාස හා ගොඩනැගිලි වලට අමතරව විශේෂයෙන් ඉදිකර ඇති ගොඩනැගිලි වනුයේ වදුරුස්ස සාරධ පෙරපාසලව, වලලිය සමගි පෙරපාසල, නැකැතිකුඹුක්වැව රෝස්බින්පෙරපාසල, වදුරුස්ස ප්‍රජාමූල බලමණ්ඩලය, වලලිය ප්‍රජා මණ්ඩලය පන්සල් ,පාසල් ආදි විශේෂ පොදු ස්ථානය 46

3.8. එල්ලංගා පද්ධතියේ කෘෂිකාර්මික බෝග වගාරටා පිලිබඳ තොරතුරු 47

ප්‍රදේශයේ දුඹුරු පැහැ වැලි පසකින් සමන්විතය. සියලු වැව් ඉස්මත්ත හේන් වගාව ද සැලකිය යුතු මට්ටමකින් සිදුකරනු ලබන අතර හේන් වගාව ද සිදුකරනු ලබයි. ඒ අනුව පදිංචිය ගොඩ ඉඩම් වගාව හා හේන පවතින්නේ එකම පද්ධතියක් ලෙසිනි. එල්ලංගාව තුල ප්‍රතිසංස්කරණය කරන ලද වැව් 25 ක් පවතී. මෙයට අමතරව ප්‍රතිසංස්කරණය නොකරන ලද කුඩාවැව් 16 ක් පමණ ඇත.

3.8.1. එල්ලංගා පද්ධතියේ කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිකිරීම හා බෝග රටා පිළිබඳ සංවර්ධන යෝජනා........ 49

3.9.එල්ලංගාවේ වාරිමාර්ග කලමණාකරනය (Irrigation Management) පිළිබඳ තොරතුරු 50

04. එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග 52

4.1. එල්ලංගාවේ උග්‍ර ගැටළු ප්‍රමුඛතාවය අනුව 52

4.2 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් 61

4.3. ක්‍රියාත්මක සැලැස්ම Piduruwella Cascade 68

වගු ලැයිස්තුව

වගුඅංක 01- පිදුරුවැල්ලැව එල්ලංගවට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 05 තුල ජීවත්වන ජනගහනය........ 8
වගුඅංක 02 - පිදුරුවැල්ලැව එල්ලංගාව පිළිබඳ පරිපාලන තොරතුරු 10
වගුඅංක 03 - එල්ලංගාවේ භූමි පරිභෝජනය........ 12
වගුඅංක 04 - එල්ලංගාවේ වැව් පිලිබඳ තොරතුරු........ 15
වගුඅංක 05 - පිදුරුවැල්ලැව එල්ලංගාව යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් පිළිබඳ විස්තර 17
වගුඅංක 06 - වාර්ෂික උෂ්ණත්ව තත්ත්වයන් 40
වගුඅංක 07 - වගා කල හැකි කුඹුරු ප්‍රමාණය........ 47
වගුඅංක 08 - වගා කන්න 48
වගුඅංක 09 - යෝජිත බෝග රටා 48
වගුඅංක 10 - කලාපයට ලැබෙන වර්ෂාපතනය අගයන් (මිලිමීටර)........ 51
වගුඅංක 11 - පිදුරුවැල්ලැව හරස්කඩ වාරිකාවෙන් හඳුනාගත් ප්‍රමුඛතා ගතකල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම........ 61
වගු අංක 12-ඇස්තමේන්තුගත වියදම - එකතුව -රු.මි.13.15 68

ප්‍රස්තාර ලැයිස්තුව

ප්‍රස්තාර අංක 01- එල්ලංගාවේ භූමි පරිභෝජනය 14
ප්‍රස්තාර අංක 02 - මැදියාව මධ්‍යස්තානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම........ 39
ප්‍රස්තාර අංක 03 - අතරගල්ල මධ්‍යස්තානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම 39
ප්‍රස්තාර අංක 04 - ඉඟිනිමිටිය මධ්‍යස්තානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම........ 39

ප්‍රස්තාර අංක 05 - වයස් බාණ්ඩ අනුව එල්ලංගාවේ ජනගහනය -පිරිමි 44
ප්‍රස්තාර අංක 06 - වයස් බාණ්ඩ අනුව එල්ලංගාවේ ජනගහනය -ගැහැණු... 44
ප්‍රස්තාර අංක 07 - ජනගහනය අනුව අධ්‍යාපන මට්ටම 45
ප්‍රස්තාර අංක 08 - රැකියා නියුක්තිය 46

රූපසටහන් ලැයිස්තුව

රූප සටහන 01 - සාමාන්‍ය එල්ලංගා පද්ධතියක ආකෘතියක්.. 1
රූප සටහන 02 - පැරණි වැවක පවතින ප්‍රධාන කොටස්.. 3

01.හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුණු කුඩා හා මධ්‍යම පරිමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත වූ ද්විතිය හා තෘතීය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයක් වන අතර, එමඟින් මුලු පරිසර පද්ධතියේම තිරසාර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ ඉතාමත් විශිෂ්ඨ නිර්මාණයක් වන එල්ලංගාව ආරක්ෂා කර සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් ("දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය") මගින් සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මග පෙන්වීම සිදුකරයි.

එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

රූප සටහන 01 - සාමාන්‍ය එල්ලංගා පද්ධතියක ආකෘතියක්



මෙවැනි එල්ලංගා පද්ධතියක් නිසි ආකාරව පවත්වා ගැනීමටත් නිසි කළමනාකරණයකින් යුක්තව එල්ලංගාවේ ජලය බෙදා හැරීමටත් සුදුසු වන පරිදි අතීතයේ සිටම වාරි පද්ධතිය නිර්මාණය කර ඇත. ඒ අනුව එල්ලංගාවේ ප්‍රධානතම අංගයක් වන වැවක අනිවාර්යයෙන්ම පැවතිය යුතු අංග කිහිපයක් පවතී. මෙම අංග නිසි ආකාරව ඉදි කිරීම හා නිසි ආකාරව නඩත්තු කිරීම එල්ලංගාවේ මනා ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපායි. ඒ අනුව එල්ලංගා පද්ධති කළමනාකරනයේ දී වැවක පැවතිය යුතු පහත කොටස් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධතියක ප්‍රධාන අංගයක් ලෙස වැව හඳුනාගත හැක.ඒ අනුව වැවක පැවතිය යුතු ප්‍රධාන අංග ලෙස සොරොව්ව, වැව් බැම්ම, වාන, වාන් ඇළ, රළපනාව, ඇළ වේලි, කට්ට කඩුව, ගොඩවල, පෙරහන, කුණු ඇළ ආදී කොටස් හඳුනා ගත හැක. වැවක අනිවාර්යයෙන් පැවතිය යුතු මෙම අංග සම්බන්ධව ඇතිවන ගැටළු වැව ආශ්‍රිතව සිදුකරන කෘෂිකාර්මික, ධීවර ආදි නිෂ්පාදන කෙරෙහිද අනෙකුත් මානව හා පාරිසරික ක්‍රියාකාරකම් කෙරෙහි ද සෘණාත්මකව බලපානු ලබයි.

<u>කට්ට කඩුව</u>

වැවක කට්ට කඩුව සාමාන්‍යයෙන් වැව් බැම්මට පහතින් වැව් බැම්මේ සිට මීටර 5ක වපසරියක් තුල සිටුවන ලද ගස් වලින් සමන්විත වේ. මෙමගින් වැව් බැම්මේ ආරක්ෂාව, ඇළ වේලි මගින් ගලායන ජලයේ කිවුල උරා ගැනීම ආදි ප්‍රයෝජන ලබා ගත හැකි වේ.

<u>පෙරහන (උස්වැටිය)</u>

වැවක පෙරහන ලෙස හඳුන්වන්නේ වැව වටා වැවට ගලා ඒන ජලය පෙරීමකට භාජනය වීම තුලින් වැවට රොන්මඩ හා කැලි කසල ඒකතු වීම වැලැක්වීම සඳහා සකසා ඇති ගස් ගොම්මනකි. මෙය වැවේ ජලය රඳාපැවතීම සඳහා ද ප්‍රයෝජනවත් වේ.

<u>පිටවාන හා වාන් ඇළ</u>

වර්ෂාව සහිත කාල සීමාවලදී වැවේ වැඩි වතුර පිටාර යාම සඳහා පිටවාන සහ එසේ පිටාර යන වතුර විධිමත් පරිදි එල්ලංගාවේ වෙනත් වැවකට හෝ ජල මාර්ගයකට ගලා ගෙන යාම සඳහා වාන් ඇළ නිර්මාණය කර ඇත. මෙසේ පිටවාන හෝ වාන් ඇල අවිධිමත්වීම ගංවතුර තත්ත්ව ඇතිවීමට හා වැවේ ධාරිතාවය අඩු වැඩි වීමට හේතු වේ.

<u>සොරොව්ව</u>

වැවක ජලය වර්ෂාව නොමැති කාල වලදී නිසි කළමනාකරණයකින් යුක්තව නිකුත් කිරීම සඳහා සොරොව්ව පිහිටුවා ඇත. නිසි කළමනාකාරණයකින් යුක්තව ජලය බෙදා හැරීම මගින් වර්ෂාව හිඟ කාලසීමා වලදී කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම වෙනත් මානව ක්‍රියාකාරකම් සඳහා ද ජලය ගබඩා කර ගැනීමට හැකියාව ලැබේ.

<u>ඇළවේලි</u>

වර්ෂාව හිඟ කාලවලදී සොරොව්වෙන් නිකුත් කරන ජලය විධිමත්ව වගා බිම් වෙත යොමු කිරීම මෙමගින් සිදු කරයි. මෙය වර්ෂාව හිඟ කාලසීමාවේ දී වැවේ ජලය නිසි කළමනාකරනයකින් යුක්තව භාවිතා කිරීමට බෙහෙවින් උපකාරී වේ. ඇළවේලි විධිමත් නොවීම අවිධිමත් ජල කළමනාකරණයට හා වර්ෂාව හිඟ කාලවලදී වගාබිම් වලට ජලය හිඟවීමට හේතු වේ.

<u>ගොඩවල</u>

අතීතයේ සිට වැවක පැවතිය යුතු අංග කුමන හෝ විශේෂිත කාරණයක් මත වැව හා සම්බන්ධ කර ඇත. වැවක ගොඩවල යනු වැවට ජලය එකතු වීමට පෙර වැවට ඉහළින් වැවේ ප්‍රමාණය හා වැවට එකතුවන ජල ධාරාවේ ප්‍රමාණය අනුව පහත් බිමක් (වලක්) ලෙස සකස් කර ඇති ඉඩ ප්‍රදේශයයි. මෙමගින් වැවට ජලය එකතුවීමට පෙර එම වලට එක්රැස් වන බැවින් ජලයේ ඇති රොන්මඩ ආදිය එම වලෙහි තැන්පත් වී පිරිසිදු ජලය වැවට එක්රැස් වීම සිදු වේ. එමගින් වැව ගොඩවීම හා වැව අපිරිසිදු වීම වැලකී යයි.

වැව් බැම්ම

වැවක ප්‍රධානතම අංගය වන්නේ වැව් බැම්ම වේ. යම් කිසි ජලමාර්ගයක් හරස් කර ජලය එක්රැස් කර ගැනීම සඳහා සකස් කර ඇති බැම්ම වැව් බැම්ම (වැකන්ද) ලෙස හැඳින්වේ. වැව් බැම්මේ දිග, පළල හා උස වැවේ ජල ධාරිතාවය අනුව වෙනස් වේ. සාමාන්‍යයෙන් වැවේ එකතු වන ජලයේ පීඩනය දැරිය හැකිවන පරිදි අර්ධ කවාකාර ආකාරයට මෙය නිර්මානය කර ඇත. වැවක වැව් බැම්මේ ශක්තිමත් බව ඉතා වැදගත් වේ. ජලය කාන්දු නොවන ආකාරයේ ශක්තිමත් වැව් බැම්මක් පිහිටීම වැවේ ජලය අපතේ නොයාමට හා වැවට පහතින් පිහිටි පහත්බිම් ආරක්ෂාවීමට හේතු වේ.

රූපසටහන 02 - පැරණි වැවක පවතින ප්‍රධාන කොටස්

1.1. ප්‍රදේශයේ පවතින එල්ලංගා පිළිබඳ මූලික හැඳින්වීම:

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල එල්ලංගා 22 ක් පිහිටා ඇත. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද්දේ එල්ලංගා පද්ධති 09 ක් පමණි. මින් විශාලතම එල්ලංගාව පිදුරුවැල්ලෑව එල්ලංගාවයි. පිදුරුවැල්ලෑව එල්ලංගා පද්ධතිය යටතේ වැව් 25ක් දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය සඳහා තෝරා ගන්නා ලදි. පිදුරුවැල්ලෑව එල්ලංගාව මී ඔය ද්‍රෝණියේ පිහිටා ඇත. එල්ලංගාව ජලය අවසන් වශයෙන් පිදුරුවැල්ලෑව වැව මගින් ඉගිණිමිටිය ජලාශයට ගලා බසී. පිදුරුවැල්ලෑව එල්ලංගාව වළලිය, වඳුරැස්ස, බොරවැව, නෑකැති කුඹුක්වැව හා පපත්වල යන ග්‍රාම නිලධාරි වසම් වල විසිරී පවතී.

පිදුරුවැල්ලෑව එල්ලංගාවට යාබදව මී ඔය ගංගා ද්‍රෝණියේ එල්ලංගා පද්ධති 04ක් පිහිටා ඇත. ඒවා නම්, පලාපත්වල එල්ලංගාව, බොරවැව එල්ලංගාව, අස්වැද්දුම එල්ලංගාව සහ මහදිවුල්වැව එල්ලංගාවයි. මෙම එල්ලංගා සියල්ල අඹන්පොල ගොවිජන සේවා බල ප්‍රදේශය තුල පිහිටා ඇත. ඉන් පලාපත්වල එල්ලංගාව තුල වැව් 10ක් පිහිටා ඇත. එහි කොටසක ජනතාව පදිංචි වී කෘෂිකාර්මික කටයුතු සිදු කරනු ලබයි. ඉතිරි කොටස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කැලෑ ප්‍රදේශය වේ. බොරවැව එල්ලංගාව තුල වැව්

05ක් පිහිටා ඇත. පන්සල් ඉඩම්, කුඩා වනාන්තර සහ පෞද්ගලික ඉඩම් වලින් එල්ලංගාව සමන්විත වේ. අස්වැද්දුම එල්ලංගා පද්ධතිය තුල වැව් 02ක් ඇත.

සිතියම අංක 01 - ප්‍රදේශයේ පවතින පළාපත්වල එල්ලංගාව



1.2. පිදුරුවැල්ලැව එල්ලංගාව හා එහි පිහිටීම

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති 22ක් පිහිටා ඇත. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරා ගන්නා ලද්දේ එල්ලංගා පද්ධති 09ක් පමණි. මින් විශාලතම එල්ලංගා පද්ධතිය වනුයේ ග්‍රාම නිලධාරි වසම් 05කට අයත් පිදුරුවැල්ලැව එල්ලංගාවයි. පිදුරුවැල්ලැව එල්ලංගාවට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 05ට අදාළ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 2905.99කි. මුළු ජනගහනය ග්‍රාම නිලධාරි වසම් 05 ට අයත් 4023 (ගැහැණු -2016 පිරිමි-2007) කි.

පිදුරුවැල්ලැව වැවෙහි නමපට බැඳීම සම්බන්ධයෙන් ජනප්‍රවාදයෙහි විවිධ කතා පැතිර ඇත. දුටුගැමුණු රජුගේ සහෝදරයෙකු වන පැරණි යාපහුව රාජධානිය පැවති සමයේදී රජකම් කල සද්ධාතිස්ස රජතුමා විසින් මෙම වැව කරවූ බව අතීත කතා වල සඳහන් වේ. වැව ඉදිකරමින් සිටියදී දුටුගැමුණු රජුට අසනීප වී ඇති අතර ඒ වන විටත් වැවේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වූ බවත් වැවේ ඉදි නොකළ කොටස (වැවේ කඩක්කරය) පිදුරු සමග වැලි මිශ්‍ර කර වසා වැව ඉදිකිරීම් අවසන් බව දුටු ගැමුණු රජුට පෙන්වූ බවත් ඒ හේතුවෙන් මෙම වැවට පිදුරුවැල්ලැව යන නම පටබැඳුන බවත් ජනප්‍රවාදයෙහි ප්‍රකට කතාවක් වේ.

මෙම එල්ලංගා පද්ධතියට අයත් ග්‍රාම සේවා වසම් 05ට අයත් මුළු භූමි ප්‍රමාණය හෙක්. 2905.99 ක් පමණ වුවත් එල්ලංගාවට අයත් මුළු භූමි ප්‍රමාණය අක්කර 2362.7(හෙක්ටයාර 944.8)ක් පමණවේ.එල්ලංගාව තුළ වැව් 41ක් පිහිටා ඇති බව දේශගුණ සුහුරු ව්‍යාපෘතියේ ජල කලමණාකරන අංශ වාර්තාවේ සඳහන් වේ.දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ වැව් 27ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂිත වුවත්,

ප්‍රතිසංස්කරණය කරන ලද්දේ වැව් 25ක් පමණි.එල්ලංගාවට අයත් කුඹුරු වල මුළු භූමි ප්‍රමාණය 180(ha)ක් වන අතර මහ කන්නයේ හෙක්ටයාර 180ක සහ යල කන්නයේ හෙක්ටයාර 76ක වී වගා කරනු ලබයි.

මී ඔය ගංගා ද්‍රෝණියේ පිහිටි පිදුරුවැල්ලෑව එල්ලංගාව මුහුදු මට්ටමේ සිට ඉහල මායිමේ උස අඩි 280ක් පමණ වේ. ප්‍රතිසංස්කරණය කරන ලද මුළු වැව් 25ට අදාල මුළු ජල ධාරිතාවය ප්‍රතිසංස්කරණයට පෙර අක්කර අඩි 995.08ක් පමණ වන අතර ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව ලෙස 611ක් ලෙස හදුනාගත හැක. වැව් ප්‍රතිසංස්කරණයෙන් පසු අපේක්ෂිත ජල ධාරිතාවය අක්කර අඩි1136.7කි.

එල්ලංගාවේ දැනට වී නිෂ්පාදනය මහ කන්නය මෙට්‍රික් ටොන් 512ක් වන අතර යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රක් ටොන් 205කි. සම්පූර්ණ එල්ලංගා පද්ධතියම අඩි 280ක පමණ උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. පිදුරුවැල්ලෑව එල්ලංගාවට අයත් විශාලතම වැව පිදුරුවැල්ලෑව වැවයි. එය එල්ලංගාවේ පහලින්ම පිහිටා ඇත. වැවේ ජල ධාර්තාවය අක්කර අඩි 274.2 ක් වන අතර වැවෙන් පෝෂිත භූමි ප්‍රමාණය අක්කර 70කි. ප්‍රතිලාභි පවුල් ගණන 70කි. එල්ලංගාව කරුවලගහ කන්ද, මිල්ලුව කන්දඋඩවලලිය, මානිගම්මුව ගං සීමාව, වදුරුස්ස. වානිගමුව, පාළුගම සීමාව, කැත්තපහුව, බොරවැව පන්සල, පනාදරගම, ඌරැව සීමාව වැනි සීමාවන් යටතේ පිහිටා ඇත.

මුළු එල්ලංගා පද්ධතියට අදාළ සියළු වාරි පර්යන්ත යටතේ ඇති භූමි ප්‍රදේශය අක්කර 2362.7කි. මුළු එල්ලංගා පද්ධතිය තුලම වනාන්තර අක්කර 484.8ක් ද කුඹුරු අක්කර 419.5ක් ද වන අතර මුඩු බිම් අක්කර 401ක් ද වැව් වල ජල පෝෂක ප්‍රදේශය ලෙස අක්කර 249.4ක් ද ජනාවාස ප්‍රදේශ ලෙස අක්කර 807.7ක් ද හඳුනා ගත හැක.

මෙම කලාපයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමි ප්‍රමාණය ලෙස සඳහන් වනුයේ හෙක්ටයාර 54කින් යුත් කොසැත්තෑව කැල ප්‍රදේශයයි.(මීට අමතරව ස්වරංගල නැමැති කැලෑ ප්‍රදේශයක් ඇති බවත් එහි තේක්ක වගා කර ඇති බවත් ප්‍රදේශයේ ගොවි නියෝජිතයින් සඳහන් කරන ලදී).වියළි කලාපයට අයත් කටු පදුරු සහිත ළඳු කැලෑ සහිත තැනිතලා බිමක් කොට්ඨාසය පුරා දක්නට ඇත.රජයට අයත් ඉඩම් සහ පෞද්ගලික ඉඩම් වලින් එල්ලංගාව සමන්විත වේ.

මෙම එල්ලංගා පද්ධතියේ වැව් 41ක් පමණ පිහිටා තිබෙන අතර ඉන් හදුනාගත් වැව් 25ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තෝරා ගන්නා ලදී. වැව් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංස්කරණය කර මේ වන විට වැව් 25 ගොවි ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ගොවි සමිති වලට භාර දී ඇත. ප්‍රතිසංස්කරණය කරන ලද සමහරක් වැව් වල අඩුපාඩු ඇති බව හරස්කඩ චාරිකාවන්හිදී හා ගොවි සංවිධානවල නියෝජිතයන් සමග කරන ලද සාකච්ඡා වන්හිදී පැහැදිලි වූ අතර එම අඩුපාඩු ඇතුලත් කර සකස් කරන ලද එල්ලංගා කළමණාකරන සැලැස්මක් මඟින් එල්ලංගා කළමණාකරන කමිටුවක් හරහා ප්‍රතිසංස්කරණය කරගැනීමට අපේක්ෂිතය.

එල්ලංගාව යටතේ ප්‍රතිසංස්කරණය සඳහා තෝරාගත් එහෙත් ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි වූ හදුනාගත් වැව් කිහිපයක් ලෙස කොරකහ වැව, (නඩු කටයුත්තක් හේතුවෙන් ප්‍රතිසංස්කරණය සඳහා තෝරා නොගන්නා ලදි.) දං ගහවැව, නිකපිටිගම වැව, ඉහල හිරියාලේගම, ඉහල ගල වැව යනාදිය හැඳින්විය හැක. මින් ඉහල ගල වැව වන සංරක්ෂිතය තුලම පිහිටා ඇති කුළු වැවකි.

සිතියම් අංක 02- පිදුරුවැල්ලැව එල්ලංගාවට අයත් වැව් වල පිහිටීම



1.3. ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පිදුරුවැල්ලැව එල්ලංගාව

වගු අංක 01 - පිදුරුවැල්ලැව එල්ලංගවට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 05 තුල ජීවත්වන ජනගහනය

අංක	ග්‍රා.නි. කොට්ඨාශයේ නම හා අංකය	ව්‍යාප්තිය හෙක්ටයාර	ජන ගහනය			ප්‍රදේශය තුල ගම් ගණන
			ස්ත්‍රී	පුරුෂ	එකතුව	
01	වළලිය - 171	868.85	468	453	921	07
02	වඳුරස්ස - 170	592.61	423	495	918	06
03	බොරවැව-174	449.68	371	319	690	08
04	නැකැති කුඹුක්වැව - 172	306.75	405	374	779	06
05	පලාපත්වල - 173	688.10	349	366	715	07

මූලාශ්‍රය - අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - සම්පත් පැතිකඩ-2023

සිතියම්අංක 03 - මී ඔය ගංගා ද්‍රෝණියේ එල්ලංගාව පිහිටීම



මූලාශ්‍රය - ජල කළමනාකරණ සැලැස්ම (දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය)

සිතියම අංක 04 - අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිදුරුවැල්ලැවට අයත් ග්‍රාම නිලධාරිකොට්ඨාශ



සිතියම අංක 05 - පිදුරුවැල්ලැව එල්ලංගාව පිහිටීම



මූලාශ්‍රය - (දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය)

1.4. පිදුරුවැල්ලෑව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු

වගු අංක02 - පිදුරුවැල්ලෑව එල්ලංගාව පිළිබඳ පරිපාලන තොරතුරු

මූලික තොරතුරු	**විස්තර**	**විශේෂිත කරුණු**
දිස්ත්‍රික්කය	කුරුණෑගල	වයඹ පළාත
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	අඹන්පොල	මුළු එල්ලංගා පද්ධති ගණන 22 කි. මුළු වැව් ගණන 133කි. වැව් වලට අයත් මුළු භූමි ප්‍රමාණය 1062 (හෙක්ටයාර) මුළු පවුල් ගණන 3132
මැතිවරණ බල ප්‍රදේශය	යාපහුව	
ගංගා ද්‍රෝණියේ	මී ඔය	ගංගා ද්‍රෝනිය වර්ග කි.මී.1530 පුරා ව්‍යාප්තව් ඇති අතර දිග කි.මී.118 වේ.
එල්ලංගාව යටතේ ප්‍රතිසංස්කරණය සඳහා තෝරාගත් වැව් සංඛ්‍යාව	25	මුලින්ම එල්ලංගාව යටතේ වැව් 27 ප්‍රතිසංස්කරණය සඳහා තෝරාගන්නා ලදි. ප්‍රතිසංස්කරණය සිදුකරන ලද වැව් සංඛ්‍යාව 25කි. දං ගහ වැව,කොරකහ වැව ප්‍රතිසංස්කරණය නොකරන ලද වැව්ය.
එල්ලංගාවට අයත් භූමි ප්‍රමාණය	අක්කර 2362.7	මූලාශ්‍රය-ජලකල මනාකරණ වාර්තාව (දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)
වනාන්තර ප්‍රමාණය	අක්කර 484.8.	වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවට අයත් බව සඳහන් කරන හෙක්ටයාර 54(කොසැත්තෑව කැලය) පිදුරුවැල්ලෑව ගමට යන පාරේ පිහිටා ඇත.
එල්ලංගාව යටතේ පිහිටි ප්‍රතිසංස්කරණය නොකරන ලද වැව්	16කි.	කොරකහ වැව (නඩු කටයුත්තක් හේතුවෙන් ප්‍රතිසංස්කරණය නොකරන ලදි), දංගහ වැව, ඉහල ගල වැව (සම්පූර්ණයෙන්ම කැලෑව තුල පිහිටා ඇත) නිකපිටිගම වැව, ඉහල දංගහ වැව, ඉහල බඩ බැද්දෑව යන ආදි ලෙස වැව් කිහිපයක්)
ග්‍රාම නිලධාරී කොට්ඨාශ	වලලිය-171 / වඳුරුස්ස / නැකැතිකුඹුක්වැව-172/ පලාපත්වල-173/ 174 -බොරවැව	බොරවැව ග්‍රාම නිලධාරි කොට්ඨාශය- (පිදුරුවැල්ලෑව වැව) වලලිය ග්‍රාම නිලධාරි කොට්ඨාශය (මිල්ලගහ වැව, කොසැත්තෑව වැව, පහළ බෝගහ වැව, වලලිය මහ වැව, ඉහළ බෝගහ වැව, ඉහළ තන්තිරියාගම වැව, හිරියාලේගම වැව, පහළ තන්තිරියාගම

		වැව, අබ වැව, බඩබැද්දැව වැව යන වැව් පිහිටා ඇත. වදුරැස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාශය (පහළ කුඩා වත්තේ වැව, ඉහළ යන්තම්පලගම වැව, කරුවලගස් වැව , දවුල්කාරයාගේවැව, පහළ යන්තම්පලගම වැව, බුලන වැව, පාලුගම වැව, උඩවලලිය වැව, වත්තේ වැව මීගහ වැව) යන වැව් පිහිටා ඇත. නැකැති කුඹුක්වැව වසම තුල බෙරු වැවත් පිහිටා ඇත. පලාපත්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුල ඌරා වැවත් පිහිටා ඇත.
එල්ලංගාවට අයත් ග්‍රාම නිළධාරි කොට්ටාශ වල මුළු භූමි ප්‍රමාණය හා ජනගහනය	හෙක්ටයාර 2905.99	මුළු ජනගහනය 4023(ගැහැණු -2016-පිරිමි-2007
එල්ලංගාවට අයත් මුළු භූමි ප්‍රමාණය	945.08 හෙක්ටයාර	ජනගහනය 2568(දල වශයෙන් ගණනය කරන ලදී).එල්ලංගාවට අයත් වැව් 01 බැගින් පළාපත්වල,නැකැති කුඹුක් වැව හා බොර වැව යන වසම් වල පිහිටා ඇති බැවිණි.
වැවෙන් පෝෂිත භූමි ප්‍රමාණය (කුඹුරු අක්කර)	446.549	මුලාශ්‍රය- අඹන්පොල ගොවිජන සේවා මධ්‍යස්ථානය
වැව් වලට අයත් භූමි ප්‍රමාණය	180 හෙක්ටයාර	භූමි පරිභෝජනය වී වගාව යල කන්නය-76(ha) මහ කන්නය හෙක්ටයාර 180(ha)
පෝෂිත කෘෂි බිම් ප්‍රමාණය	මඩ ඉඩම් කුඹුරු (275ha) ගොඩ ඉඩම් -294(ha)	වී නිෂ්පාදනය මහා කන්නය 512මෙට්‍රික් ටොන් යල කන්නය මෙට්‍රික් ටොන් 205
එල්ලංගාවට අයත් වැව්වල මුළු ජලධාරිතාවය ප්‍රතිසංස්කරනයෙන් පසු	අක්කර අඩි 1136.7	මුලාශ්‍රය ජල කලමනාකරන වාර්තාව-දේශගුණ සුහුරු ව්‍යාපෘතිය
එල්ලංගාවේ පෝෂක ප්‍රදේශයේ පදිංචි ගොවි පවුල් සංඛ්‍යාව	611	මුලාශ්‍රය ජල කළමනාකරන වාර්තාව-දේශගුණ සුහුරු ව්‍යාපෘතිය
එල්ලංගාවට අයත් ගොවි සංවිධාන	05	බොර වැව-සද්ධාතිස්ස ගොවි සංවිධානය 100 වදුරැස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාශය -කුමාර ගොවි සංවිධානය ගොවීන් සංඛ්‍යාව 150 වලලිය ග්‍රාම නිලධාරි කොට්ඨාශය පැරකුම් ගොවි සංවිධානය- ගොවීන් ගණන 200 නැකැති කුඹුක්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාශය එකමුතු ගොවි සංවිධානය

		ගොවීන් 40 පළාපත්වල ග්‍රාම නිලධාරි කොට්ඨාශය එක්සත් ගොවි සංවිධානය

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ - අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

වගු අංක 03- එල්ලංගාවේ භූමි පරිභෝජනය

අංකය	වැවේ නම	මුළු භූමි ප්‍රමාණය (අක්කර)	වනාන්තර (අක්කර)	කුඹුරු (අක්කර)	ජලපෝෂක ප්‍රදේශය((අක්කර)Water Bodies	ජනාවාස (අක්කර)	මුඩුබිම් (අක්කර)
1	පිදුරුවැල්ලැව වැව	763.6	154.9	202.5	64.0	204.1	138.1
2	අඹ වැව	22.0	20.1	0.0	2.0	0.0	0.0
3	කොසැත්තැව වැව	202.9	29.6	52.9	38.8	69.6	12.0
4	බඩබැද්දැව වැව	25.5	2.7	3.2	2.1	8.4	8.9
5	වල්පාලුව වැව	71.7	4.0	26.0	12.0	10.6	19.1
6	බෙරු වැව	30.6	0.0	0.0	3.5	18.5	8.7
7	දවුල්කාරයාගේ වැව	28.7	14.2	0.5	2.8	0.0	11.2
8	පාලුගම වැව	70.2	23.5	0.0	8.2	6.3	32.2
9	මීගහ වැව	11.4	0.0	0.0	1.9	0.0	9.5
10	බුලන වැව	120.3	0.0	22.4	21.5	44.6	31.8
11	වලලිය මහවැව	22.2	0.0	0.0	1.2	21.0	0.0
12	පහල කුඩා වත්තේ වැව	69.7	15.0	1.3	8.5	35.0	9.8
13	වදුරුස්සගම වැව	105.3	0.0	32.0	15.5	55.1	2.6
14	උඩවලලිය	135.9	44.6	19.0	14.1	36.0	22.2
15	කරුවලගස්වැව	54.1	9.2	0.0	2.2	41.3	1.4

16	වත්තේවැව	52.4	0.0	9.0	3.9	38.0	1.5
17	පහලයන්තම්පලගම වැව	85.0	41.8	0.0	8.6	27.0	7.5
18	ඉහල යන්තම්පලගම වැව	46.2	16.5	4.4	1.9	21.3	2.1
19	පහල බෝගහ වැව	116.9	15.5	30.1	3.9	28.7	38.7
20	ඉහල බෝගහ වැව	45.7	0.0	6.6	6.0	31.9	1.3
21	පහල තංතිරියාව වැව	75.1	0.0	6.9	4.7	48.4	15.1
22	ඉහල තංතිරියාව වැව	36.1	21.4	0.0	3.0	0.0	11.7
23	ඌරුව වැව	55.6	26.3	0.0	5.8	16.0	7.4
24	පහල හිරියාලගම වැව	56.8	40.3	2.7	8.8	0.7	4.3
25	මිල්ලගහවැව	58.8	5.2	0.0	4.5	45.2	3.9
	එකතුව	2362.7	484.8	419.5	249.4	807.7	401

මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ ග්‍රන්ථය (දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය)

ප්‍රස්තාර අංක 01- එල්ලංගාවේ භූමි පරිභෝජනය



මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ ග්‍රන්ථය (දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය)

1.4.1එල්ලංගාවේ වැව් පිළිබඳ තොරතුරු

වැව් ප්‍රතිසංස්කරණයට පෙර ජල ධාරිතාවය හා ප්‍රතිසංස්කරණයෙන් පසු අපේක්ෂිත ජල ධාරිතාවයන් පහත පරිදි වේ.

වගු අංක 04 - එල්ලංගාවේ වැව් පිළිබඳ තොරතුරු

අනු අංකය	වැව	ගොවි පවුල් ගණන	පෝෂිත ප්‍රදේශය(අක්කර)	ප්‍රතිසංස්කරනයට පෙර ජල ධාරිතාවය (අක්කර/අඩි)	ප්‍රතිසංස්කරණයෙන් පසු ජල ධාරිතාවය (අක්කර/අඩි)
1	පිදුරුවැල්ලැව වැව	70	70.0	274.2	285.8
2	අඹ වැව	8	4.903	5.8	8.9
3	කොසැත්තැව වැව	15	12.484	28.6	35.2
4	බඩබැද්දැව වැව	12	11.382	19.0	19.9
5	වල්පාලුව වැව	13	17.3	52.2	57.8
6	බෙරු වැව	5	5.0	17.2	19.9
7	දවුල්කාරයාගේ වැව	5	4.3	16.6	18.9
8	පලුගම වැව	18	12.2	41.3	45.8
9	මීගහවැව	9	8.1	8.6	11.4
10	බුලනවැව	42	29.1	101.1	116.4
11	වලිලිය මහවැව	150	61.873	53.7	70.3
12	පහල කුඩා වත්තේ වැව	24	11.0	23.4	32.5
13	වදුරුස්සගම වැව	28	8.0	49.1	53.5
14	උඩවලලිය වැව	20	37.285	64.3	81.2
15	කරුවලගස්වැව	42	22.0	53.2	61.0
16	වත්තේවැව	10	3.2	9.3	10.9
17	පහල යන්තම්පලගම වැව	15	10	16.0	24.3
18	ඉහල යන්තම්පලගම වැව	20	12	17.2	22.0

19	පහල බෝගහ වැව	7	5.68	4.9	6.1
20	ඉහල බෝගහ වැව	6	4.0	6.0	6.9
21	පහලතංතිරියාව වැව	4	10.608	14.6	15.9
22	ඉහල තංතිරියාව වැව	12	6.983	11.8	15.2
23	පහල හිරියාලේගම වැව	18	20.0	22.5	24.1
24	මිල්ලගහ වැව	15	8.561	19.1	24.8
25	ඌරැව වැව	43	50.5	66.0	68.0
	එකතුව	611	432.5	995.8	1136.7

මූලාශ්‍රය - අඹන්පොල ගොවිජන සේවා මධ්‍යස්ථානය

1.4.2.පිදුරුවැල්ලැව එල්ලංගාව යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් පිළිබද විස්තර

වගු අංක 05- පිදුරුවැල්ලැව එල්ලංගාව යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් පිළිබද විස්තර

වැවෙහි නම	භාවිතයටගනු ලබන සහ අත්හරින ලද වැවක්ද යන්න	ජලධාරිතාවය අක්කර /අඩි	එම වැවේප්‍රතිලාභී ගොවි පවුල්සංඛ්‍යාව	ග්‍රාම නිළධාරි වසම	වැවෙන්පෝෂණය වන වගා භූමිප්‍රමාණය අක්කර	භූගෝලීයඛණ්ඩාංක	
						අක්ෂාංශ	දේශාංශ
දවුල්කාරයාගේ වැව	භාවිතයට ගනු ලැබේ	16.6	5	වදුරැස්ස	4.3	7.858877	80.21904
වත්තේ වැව	භාවිතයට ගනු ලැබේ	9.3	10	වදුරැස්ස	3.2	7.847991	80.20097
මීගහ වැව	භාවිතයට ගනු ලැබේ	8.6	9	වදුරැස්ස	8.1	7.855888	80.21718
පහල වල්පාළුව වැව	භාවිතයට ගනු ලැබේ	52.2	13	වදුරැස්ස	17.3	7.861928	80.21685
කරුවලගස් වැව	භාවිතයට ගනු ලැබේ	53.2	42	වදුරැස්ස	22	7.85253	80.20064
බුලන වැව	භාවිතයට ගනු ලැබේ	101.1	42	වලලිය	29.1	7.85691	80.21038
පහල කුඩා වත්තේ වැව	භාවිතයට ගනු ලැබේ	23.4	24	වදුරැස්ස	11	7.855285	80.20574
වදුරැස්සගමවැව	භාවිතයට ගනු ලැබේ	49.1	28	වදුරැස්ස	08	7.85137	80.20568
වලලියමහවැව	භාවිතයට ගනු ලැබේ	53.7	150	වලලිය	61.873	7.867775	80.20099
උඩ වලලිය වැව	භාවිතයට ගනු ලැබේ	64.3	20	වදුරැස්ස	37.285	7.858109	80.20057
පහල බෝගහ වැව	භාවිතයට ගනු ලැබේ	4.9	7	වදුරැස්ස	5.68	7.861564	80.20112

ඉහල තංතිරියාව වැව	භාවිතයට ගනු ලැබේ	11.8	12	වලලිය	6.983	7.866088	80.119714
පහල තංතිරියාවවැව	භාවිතයට ගනු ලැබේ	14.6	4	වලලිය	10.608	7.870861	80.19606
මිල්ලගහ වැව	භාවිතයට ගනු ලැබේ	19.1	15	වලලිය	8.651	7.861281	80.192262
කොසැත්තැව වැව	භාවිතයට ගනු ලැබේ	28.6	15	වලලිය	12.484	7.8756886	80.207752
බඩ බැද්දැව වැව	භාවිතයට ගනු ලැබේ	19.0	12	වලලිය	11.382	7.869269	80.20861
අඹ වැව	භාවිතයට ගනු ලැබේ	5.8	8	වලලිය	4.903	7.876744	80.19992
පාලුගමවැව	භාවිතයට ගනු ලැබේ	41.3	18	වදුරුස්ස	12.2	7.856097	80.21763
බෙරුවැව	භාවිතයට ගනු ලැබේ	17.2	5	නැකැති කුඹුක්වැව	5	7.866335	80.218899
ඉහල බෝගහ වැව	භාවිතයට ගනු ලැබේ	6.0	6	වදුරුස්ස	4	7.861564	80.20112
හිරියාලේගම වැව	භාවිතයට ගනු ලැබේ	22.5	18	වදුරුස්ස	20.00	7.86247	80.18991
ඌරුව වැව	භාවිතයට ගනු ලැබේ	66	43	පළාපත්වල	50.5	7.883999	80.19566
ඉහල යන්තම්පලගම වැව	භාවිතයට ගනු ලැබේ	17.2	20	වදුරුස්ස	12	7.855697	80.19597
පහල යන්තම්පලගම වැව	භාවිතයට ගනු ලැබේ	16.0	15	වදුරුස්ස	10	7.857437	80.19886
පිදුරුවැල්ලෑව වැව	භාවිතයට ගනු ලැබේ	274.2	70	බොරවැව	70	7.875544	80.19332
මුළු එකතුව		995.8	611		446.549		

මුලාශ්‍රය-(දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය/අඹන්පොල ගොවිජන සේවා මධ්‍යස්ථානය)

02.පිදුරුවැල්ලැව එල්ලංගාව තිරසර ලෙස කලමණාකරනය කිරීමේ වැදගත්කම

පිදුරුවැල්ලැව එල්ලංගාව වැව් 25කින් සමන්විත වන අතර මෙය ග්‍රාම නිලධාරී වසම් 5ක් තුල ව්‍යාප්තව ඇත. ග්‍රාම නිලධාරි වසම් 05ට අයත් භූමි ප්‍රමාණය හෙක්ටයාර 2905.99ක් වුවත්, බොරවැව, නැකැති කුඹුක්වැව, පළාපත්වල යන වසම් වල එල්ලංගාවට අයත් වැව් පිහිටා ඇත්තේ එක බැගිනි. ඒ අනුව මෙම එල්ලංගාව ව්‍යාප්තවී ඇත්තේ දළ වශයෙන් හෙක්ටයාර 945.08ක් වැනි භූමි ප්‍රදේශයක් තුළය.

වැව් ප්‍රතිසංස්කරණයට පෙර වැව් 25ට අදාල ජල ධාරිතාවය අක්කර අඩි 995.8 කි. එම ජලය භාවිතයෙන් වී වගාව හෙක්ටයාර 180ක මහ කන්නයේ ද හෙක්ටයාර 76ක යල කන්නයේ ද සිදු කරන අතර වී නිෂ්පාදනය මහ කන්නනයේ මෙට්‍රික් ටොන් 512ක් ද යල කන්නයේ මෙට්‍රික් ටොන් 205ක් ද වේ. ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 611ක් පමණ වේ. වැව් ප්‍රතිසංස්කරනයෙන් පසු වැව්වල අපේක්ෂිත ජල ධාරිතාවය අක්කර අඩි 1136.7ක් ලෙස වැඩිකිරීමට අපේෂිතය. ඒ අනුව වී නිෂ්පාදනය මහ කන්නනයේ මෙට්‍රික් ටොන් 614ක් ද යල කන්නයේ මෙට්‍රික් ටොන් 369ක් ද ලබාගැනීමට අපේක්ෂිතය.

මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු යල සහ මහ කන්න දෙකෙහිම සිදු කරන අතර යල කන්නයේ දී වැව් වතුර භාවිතයෙන් ද මහ කන්නයේ දි අහස් ජලය මගින් ද වගා කටයුතු සිදු කරයි. මෙහි ප්‍රධාන බෝගය ලෙස වී වගාව ද අතිරේක බෝග වශයෙන් බඩ ඉරිගු, රට කජු, මුං, පැණි කොමඩු වැනි බෝග වර්ග ද වාණිජ බෝග වශයෙන් කෙසෙල්, පොල්, ගස්ලබු වගාව ද සිදු කරනු ලබයි.

අතිරේක බෝග වගාව යටතේ ඉරිගු යල කන්නයේ හෙක්ටයාර 47ක වගා කර මෙට්‍රික් ටොන් 142 ද මහ කන්නයේ හෙක්ටයාර 38 ක වගා කර මෙට්‍රික් ටොන් 114ක් ද රටකජු යල කන්නයේ හෙක්ටයාර 57ක් වගා කර මෙට්‍රික් ටොන් 97ක් ද පැණි කොමඩු හෙක්ටයාර 24ක වගා කර මෙට්‍රික් ටොන් 146ක් ද නිෂ්පාදනය කරනු ලබයි. කෙසෙල් වගාව අක්කර 10ක පොල් වගාව අක්කර 30 පමණ සාර්ථකව සිදු කරයි. එල්ලංගාව පිහිටි වැව් ආශ්‍රිතව ධීවර කටයුතුද සුළු වශයෙන් සිදුකරනු ලැබේ.

මෙම කලාපය තුල යල කන්නයේ කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය වන්නේ වාරි ජලය වේ. එම නිසා මහ කන්නයේ වැසි ජලය වැව් ආශ්‍රිතව රඳවා තබා ගැනීමේ ධාරිතාවය වඩා ඉහළ දැමීම තුලින් යල කන්නයේ නිෂ්පාදනය ඉහළ නැංවිය හැක.

යල කන්නයේ ජලය හිගකම නිසා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය අඩුය. එබැවින් ඒ සඳහා සුදුසු කලමනාකරණ වැඩපිළිවෙලක් සකස් කර ගොවි ජනතාව දැණුවත් කල යුතුය.

මෙම එල්ලංගාව යටතේ ගොවි පවුල් 611 ක් පමණ කෘෂිකාර්මික කටයුතු වල නිරත වේ.සෙසු අය රාජ්‍ය සේවයේ, පෞද්ගලික අංශයේ, ස්වයං රැකියා වල නිරත අය සහ රැකියා නොකරන අය හා වැඩිහිටි අය වේ. එල්ලංගාවට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 05 තුල විදේශ රැකියා වල නිරත සංඛ්‍යාව 82 වන අතර එල්ලංගා වපසරිය තුල 35 ක් පමණ විදේශ රැකියාවල නිරත වේ. එල්ලංගාව තුල වැඩිහිටි ශ්‍රමිකයින් ගණන අඩු බවක් නිරීක්ෂණය වේ. වසම් පහ තුල පෞද්ගලික අංශයේ රැකියා වල 412ක් පමණ නියුක්ත වන අතර රාජ්‍ය අංශයේ 400ක් පමණ නියුක්ත වේ.

එල්ලංගාව නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වුයේ වැඩකල හැකි පිරිසගෙන් 80% ක් පමණ කෘෂි කර්මාන්තයේ නියලෙන බවයි. ඔවුන්ගේ ප්‍රධානතම ආදායම් මාර්ගය වන ගොවිතැන දියුණු කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර දිය යුතුය.

පිදුරුවැල්ලැව එල්ලංගාව තුල අහිතකර මානව ක්‍රියාකාරකම් කිහිපයක් නිරීක්ෂණය විය. එය එල්ලංගාවේ තිරසර පැවැත්මට අහිතකර ලෙස සෘජුවම බලපායි. අහිතකර ලෙස භූමි පරිභෝජනය දක්නට ලැබිණි. පිදුරුවැල්ලැව වැව ඉස්මත්තේ ගොවින් අනවසර ලෙස හේන් වගාව සිදුකරනු ලබයි.

ඒ තුලින් පාංශු ඛාදනය සිදුවේ. පිදුරුවැල්ලැව වැව ඉස්මත්තේ තිබු ඉදිගස් ගොවීන් විසින් ගිණි තබා විනාශ කර හේන් වගාව සිදුකරයි. ඒ තුලින් වැවට සහ එල්ලංගා පරිසරයට වු හානිය විශාලය.

ජල පෝෂක ප්‍රදේශ හානියට පත්ව ඇත. තවද කොසැත්තෑව රක්ෂිතයට අයත් (කොසැත්තෑව) කැළෑවෙහි හේන් වගාව කිරීම සිදු කිරීම කරනු ලබයි. හේන් වගාවේදී පරිසරයේ තිරසර පැවැත්මට හානිවන අයුරින් කැලෑව පරිභෝජනය සිදුකරයි.

එමෙන් ම මිල්ලගහ වැව, පහල තංතිරියාව, ඉහල තංතිරියාව යනාදි වැව් වල වැව් ඉස්මත්තේ හේන් වගාව හා පොල් වගාව සිදුකරන බවක් දැකගත හැකිවිය. වන සංරක්ෂිතය තුල ගස් කපා ගිණි තැබීමෙන් ජල මුලාශ්‍ර විනාශ වේ. එමඟින් ඉඩම් ඛාදනයට ලක් වී ජලය වැවට ජලය ගලා ඒම තුළින් වැවේ රොන්මඩ එකතු වී වැව පිටාර ගැලීමකට ලක්ව වැවේ ජල ධාරිතාවය අඩුවීමට හේතුවේ. එය එල්ලංගාව තිරසර පැවැත්මට අහිතකර ලෙස බලපායි.

එල්ලංගාවට අයත් බොහෝ වැව් වල ආක්‍රමණික ජලජ ශාක ඇති බව නිරීක්ෂනය විය. ආක්‍රමණික ශාක වන ජපන් ජබර, Eichhornia crassipes, යනාදි ශාක වලින් උඩ වලලිය වැව, උඩ බෝගහ වැව, පලුගම වැව, වල් පාලුව වැව, කරුවලගස්වැව යන වැව් වලද ආක්‍රමණික ශාකයක් වන විල කටු (වලලිය) වැවේද වැසි ඇති බව දක්නට ලැබුණි. එය වැවේ ජල ධාරිතාවය අඩුවීමටද බලපායි. සුහුරු ව්‍යාපෘතිය යටතේ වැව් ප්‍රතිසංස්කණයේදී ඉවත්කරන ලද පස් පෝෂිත ප්‍රදේශවල ගොඩගසා තැබීමෙන් වැසි කාලයට එම පස් වැවට සෝදා ඒම තුළින් පාංශු ඛාදන තත්වයන් ඇති වි ඇති බව ගොවි ජනතාව දන්වන ලදි. එසේ පාංශු ඛාදනයට ලක්වු වැවක් ලෙස (හිරියාල වැව) දැක්විය හැක.
තවද, ගොවි සංවිධානවල නඩත්තු ක්‍රමවේදයක් නොමැති වීම, සැලසුම් නොකල භූමි පරිභෝජනය, රසායනික පොහොර හා කෘමි නාශක භාවිතය ජල සම්පත් නිසි අයුරින් ප්‍රයෝජනයට නොගැනීම, වැව් රක්ෂිත ආරක්ෂා නොකිරිම වැනි කරුණු හේතුවෙන් තිරසර බවට හානියක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. මෙසේ සාමාන්‍ය ජන ජීවිතයට සෘජුව බලාපන මෙම එල්ලංගා පද්ධතිය විවිධ මානව හා පාරිසරික ක්‍රියාකාරකම් හේතුවෙන් පරිහානියට පත්වෙමින් පවති. මේ හේතුවෙන් එල්ලංගා පද්ධතිය මගින් බලාපොරොත්තු වන ඵලදායිතාවය පහළ යමින් පවති. එම හේතුවලින් වැව් වල මාළු ගහනයද අඩුවන අතර එය ධීවර කර්මාන්තයටද අහිතකර ලෙස බලපානු ලබයි.

කෙසේ වුවද මෑතකදී එල්ලංගා පැතිකඩ සංවර්ධනය සඳහා සිදු කරනු ලැබූ සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකාවෙන් හා අදාල ලේකන පරිශීලනය මගින් එකතු කරන ලද, ජනනය කරන ලද දත්ත හා තොරතුරු තුලින් එල්ලංගාවේ විවිධ අංශ විවිධ හේතු නිසා හානියට පත් වී ඇති බව අනාවරණය විය. කෙසේ වුවද එල්ලංගාවේ පිහිටි වැව් 27න් 25ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගනිමින් ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර පිදුරුවැල්ලැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ

සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කලමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතිය සහාය ලබාදේ.

ඒ අනුව පිදුරුවැල්ලැව එල්ලංගාවට අදාළව එල්ලංගා කළමණාකරන කමිටුවක් 2023.03.08.පිහිටුවා ඇති අතර එල්ලංගාව තිරසර කළමානාකාරණය ඊකගැනීම සඳහා විශේෂ අවධානයක් යොමුකර ඇති බව සඳහන් කල හැක.

2.1. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්,"එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති තත්වයෙන් එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සම්පව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම්

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
- ප්‍රාදේශීය ලේකම්වරු,
- ගොවි සංවිධාන,
- ප්‍රජා මූලික සංවිධාන,
- ජල සම්පත් මණ්ඩලය,
- ආපදා කලමණාකරන කාර්යාංශය,
- පොලිස් දෙපාර්තමේන්තුව,
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය,
- පරිසර අධිකාරිය,
- පෞද්ගලික අංශය,
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව,
- ප්‍රාදේශීය සභාව,
- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මුල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනින් අංක 02 යටතේ දක්වා ඇත.

රූප සටහන අංක 02- එල්ලංගා පද්ධති කළමණාකරනය හා සම්බන්ධිත ප්‍රධාන ආයතනික ව්‍යුහය

2.2. එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාවට බීමට, රෙදි සේදීමට, ආහාර පිසීමට සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි.රාජ්‍ය, පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරගත යුතුය. එසේ වුවද නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක් වීමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහාත් ක්‍රියාමාර්ග ගැනීමටත් වඩාත් අවශ්‍ය වී ඇත.

2.3. එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික චත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් වූ අතර වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිළිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා,ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලැබිය.මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

2.4. පිදුරුවැල්ලැව එල්ලංගා පැතිකඩ සකස්කිරීමේ දී භාවිතා කල ක්‍රමවේදය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වලට අයත් වලලිය, බොරවැව, පළාපත්වල, නෑකැති කුඹුක් වැව, වඳුරුස්ස යන ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුල පිදුරුවැල්ලැව එල්ලංගාව පිහිටා ඇත.

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල තෝරාගත් ප්‍රතිලාභීන් වෙත විවිධ ආර්ථික කටයුතු ක්‍රියාවට නංවා ඇත. ආදර්ශ ගෙවතු වගාව. වගා ළිං ඉදිකිරීම සත්ව පාලනය, වැව් පුනරුත්තථාපනය හා නවීන කෘෂිකර්ම ක්‍රමවේදයන් හඳුන්වාදීම ආයතන සංවර්ධනය ඉන් ප්‍රධාන වේ. මෙසේ ක්‍රියාත්මක වන සියලු ක්‍රියාකාරකම් නිෂ්පාදන සංවිධාන හා නිෂ්පාදන සංගම් ගොවි සංවිධාන හරහා ක්‍රියාත්මක වේ. මෙම කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීමට හා නියාමනය කිරීම සඳහා මධ්‍ය සංවිධානයක අවශ්‍යතාවය අවශ්‍යම විය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් වැව් පුනරුත්ථාපනය වෙමින් පවතින පිදුරුවැල්ලැව එල්ලංගාව කේන්ද්‍ර කරගෙන 2023.03.08. දින එල්ලංගා කළමනාකරණ කමිටුවක් පිහිටුවන ලදී.
මෙම කමිටුව අඹන්පොල ප්‍රාදේශිය ලේකම්ගේ සභාපතිත්වයෙන් හා අදාල සියලු රාජ්‍ය ආයතන හා ස්වේච්ඡා සංවිධානවල සහභාගිත්වයෙන් ද බල ප්‍රදේශයේ සියලුම ගොවි සංවිධාන වලින් ද මෙම කමිටුව සමන්විත වේ.
මෙම කමිටුවේ ලේකම් ධූරය දරනු ලබන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරී විසිනි. ලෝක බැංකුවේ හා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ උපදෙස් අනුව ක්‍රියාත්මක වන මෙම කමිටුවට ඉතා භාරදූර වගකීමක් පැවරිණ.
එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කරනු ලබයි.
මෙම වාර්තාවෙන් එල්ලංගාවේ පවතින ගැටලු හා උග්‍ර ගැටලු ලේඛණයක් හා අවශ්‍යතා හා විසඳුම් යෝජනා පිළිඹිමු වනු ඇත. මෙහි දෙවන අදියර වන්නේ මෙම මූලික පැතිකඩ පදනම්කරගෙන එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස්කිරීමයි. මෙම සැලැස්ම අදාල රාජ්‍ය ආයතන මගින් ක්‍රියාවට නැගීමත් ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලෝක බැංකුව මගින් ලබාදීමත් මෙහි අවසන් අදියරවේ. මෙය මහත් භාරදූර වගකීමකි.
පිදුරුවැල්ලැව එල්ලංගා පැතිකඩ සකස්කිරීම සඳහා මූලාශ්‍ර කිහිපයක් ඔස්සේ තොරතුරු ලබාගන්නාලදී. හරස්කඩ චාරිකා, ද්විතීයදත්ත, කණ්ඩායම් සාකච්ඡා ඒ අතර ප්‍රධානවූ අතර ද්විතීය දත්ත ලෙස ව්‍යාපෘතියේ සංවේදී කලාප සඳහා සකස්කරන ලද කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යාත්මක තක්සේරුව හා ලේකම් කාර්යාල, ගොවිජන සේවා මධ්‍යස්ථාන, කෘෂිකර්ම අමාත්‍යාංශය,

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘති වාර්තා හා වනජීවී හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තු වලින් ලබා ගත්තොරතුරු භාවිතා කරනලදී.

මීට අමතරව ප්‍රාථමික දත්ත ජනනය කිරීම සඳහා හරස්කඩ චාරිකාවක් ද (Transect Walk) සියලු පාර්ශවකාර සංවිධාන වල සහභාගීත්වයෙන් සිදුකරන ලදී. එනම්, වලලිය, වඳුරුස්ස, බොර වැව, නැකැතිකුඹුක් වැව, පළාපත්වල යන වසම් වල පිහිටි වැව් ආවරණයවන පරිදි හරස්කඩ චාරිකාවේ දී තොරතුරු ලබාගන්නා ලදී. මේ සඳහා කණ්ඩායම් 10ක් පහත පරිදි යොදවා තොරතුරු රැස් කරන ලදි.

සියලු අදාල රාජ්‍ය ආයතන වල හා ගොවි සංවිධාන වල සහභාගිත්වයෙන් වයඹ පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ අනුග්‍රහයෙන් 2024.05.16 දින හා 2024.05.28 වන දින මෙම හරස්කඩ චාරිකාව පවත්වන ලදි. එහි දී එල්ලංගාව හරහා බොහෝ භූමි දර්ශනයන් ආවරණය කරමින් මෙම චාරිකාව. කි.මී 20ක් පමණ දුරක් ගමන් කරන ලදී. මෙය මහත් දුෂ්කර මෙන්ම අවධානම් සහිත ගමනක් විය. ඉහත සඳහන් කණ්ඩායම් 10ට මෙම සියලු නිලධාරීන් බෙදී චාරිකාවට සම්බන්ධ විය.
ඒ ඒ කණ්ඩායම් ගමන් ගත් හා ආවරණය කල ක්ෂේත්‍රයන් මෙසේය.
දිනය-2024.05.16.

කණ්ඩායම අංක 01
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය පහල තංතිරියාව වැව සිට ඉහල තංතිරියාව වැව හා වල්පාලුව වැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ ගමන් මාර්ගය කි.මී.08ක් පමණ.

කණ්ඩායම 02
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය හිරියාලේගමවැවේසිටමිල්ලගහ වැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කි.මී. 03 ක් පමණ ගමන් මාර්ගය.

කණ්ඩායම් අංක 03
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය උඩ වලලිය වැව සිට වඳුරුස්ස වැව හා කොසැත්තැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කි.මී. 08ක් පමණ ගමන් මාර්ගය.

කණ්ඩායම් අංක 04
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය ඉහල යන්තම්පලගම වැව සිට පහල යන්තම්පලගම වැව දක්වා ගමන් මාර්ගය කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කිලෝමීටර 04ක් පමණ ගමන් මාර්ගය.

කණ්ඩායම් අංක 05

වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය වලලිය වැව සිට පිදුරුවැල්ලැව වැව දක්වා කිලෝමීටර 05 ක් පමණ ගමන් මාර්ගය

කණ්ඩායම් අංක 06
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය උඩ බෝගහ වැව සිටපහල බෝගහ වැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කිලෝමීටර 02ක් පමණ ගමන් මාර්ගය

කණ්ඩායම් අංක 07
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය කරුවලගස් වැව සිට පළුගහ වැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කිලෝමීටර 02 ක් පමණ ගමන් මාර්ගය
දිනය-2024.05.28.

කණ්ඩායම අංක 01
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය බුලන වැව සිට කරුවලගස්වැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කිලෝමීටර 05 ක් පමණ ගමන් මාර්ගය

දිනය-2024.05.28.- කණ්ඩායම අංක 02
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය ඌරුව වැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කිලෝමීටර 02 ක් පමණ ගමන් මාර්ගය

දිනය-2024.05.28.- කණ්ඩායම අංක 03
වලලිය සමිති ශාලාව අසලින් ආරම්භ කළ ගමන් මාර්ගය දවුල් කාරයාගේ අඹ වැව දක්වා කුඹුරු හා ලඳු කැලෑව ඔස්සේ වූ කිලෝමීටර 05 ක් පමණ ගමන් මාර්ගය

සාමාන්‍යයෙන් අතීතයේදී හරස්කඩ චාරිකාවේදී ගමන් මාර්ගයේ මීටර් 100න් 100ට තොරතුරු ලබාගත්තද එල්ලංගා පද්ධතියක් සමාන්තර රේඛාවක නොපිහිටන බැවින් (විසිරී පවතින බැවින්) එල්ලංගාවේ වැව් වල පිහිටීම අනුව එල්ලංගාවේ භූමි ප්‍රමාණය කොටස් වලට වෙන් කර එම කොටස් අනුව කණ්ඩායම් කර බහුඅශ්‍ර ක්‍රමයට තොරතුරු රැස්කරන ලදි.
ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජආර්ථික තොරතුරු, සම්පත් භායනය හා සම්පත් භායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කරගන්නාලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතනවල නිලධාරීන් සහභාගීවූ අතර චාරිකාවෙන් එක්රැස් කරගන්නා ලද තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා 2024-06-10 දින නැවත ඊට අදාළ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වලලිය සමිති ශාලාවේදී වැඩමුළුවක් පවත්වන ලදි.
විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත්වන අතර එල්ලංගාව අධ්‍යනය කරනු ලබන අයට එල්ලංගාව පිළිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල්වනු ඇත.

ඉහත හරස්කඩ චාරිකාවෙන් ලබාගත් තොරතුරු පමණක් මෙම වාර්ථාවට ප්‍රමාණවත් නොවූ බැවින් රාජ්‍ය ආයතන වලින් ලබා ගන්නා ලද තොරතුරු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ පරිශීලනය කිරීමෙන්ද ගොවි සංවිධාන හා ගොවින්ගෙන් විවිධ අවස්ථාවලදී ලබාගත් තොරතුරු ද මෙම වාර්ථාව සඳහා පදනම් කරගනු ලැබීය.

2.5. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක්සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ.

1 ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම.

2 එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපායමාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වියයුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan)සැකසීම.

3 එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබදව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

2.6. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිළිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදි චිත්‍රයක් දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ.
එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

2.7. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පිදුරුවැල්ලැව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සඳහා

එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිළිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීයහා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධකාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කලයුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනුලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තාලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්යමණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

1. රැස්වීම් පැවැත්වීමට
2. ද්විතීය දත්ත එකතු කිරීම
3. හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
4. එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
5. එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
6. එල්ලංගා පැතිකඩ සැකසීම
7. ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම,යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
8. එල්ලංගා සැලැස්ම සැකසීම
9. පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම
10. එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කමනාකරන සැලැස්මට ඇතුලත් කර ඇත.

2.8. තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම

එල්ලංගාක්ෂේත්‍රමූලිකක්‍රියාකාරකම්ඇතුලත්බහුවිධකාර්යයකි.ඒසඳහාඑල්ලංගාකලමණාකරනසැලැස්මසැකසීමටපෙරඑල්ලංගාපැතිකඩසකස් කලයුතුඅතරඑහිදීඑල්ලංගාවේභූවිද්‍යාත්මක,පරිසරවිද්‍යාත්මක,ජලවිද්‍යාත්මක,සිතියම්විද්‍යාත්මකහාසමාජපැතිකඩතක්සේරුකිරීමසඳහාසහභාගීත්වහාබහුපාර්ශවීයක්‍රමවේදභාවිතාකරනුලබයි.

දත්තඋත්පාදනය, ත්‍රිමානකරණය, දත්තවිශ්ලේෂනය, වාර්තාලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධි දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්යමණ්ඩලයේඋපදෙස්ඇතිවදේශගුණසුහුරුවාරිකෘෂිකර්මව්‍යාපෘතියේනිලධාරීන්විසින්ඉටුකරනුලැබීය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i)රැස්වීම්පැවැත්වීමට

(ii) ද්විතීය දත්ත එකතු කිරීම

(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම (iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම

(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු පුරෝකථනය කිරීම

(vi) එල්ලංගා පැතිකඩ සැකසීම

(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම,යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x)එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන,මධ්‍යකාලීන හා දීර්ගකාලීන වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්මට ඇතුලත් කරන ලදී.

2.9. පිදුරුවැල්ලෑව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම.

පිදුරුවැල්ලෑව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි.

දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරණය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි.

එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ.

ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කලමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස ලේකන පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී.

ඒවානම්,

1. භූගෝල විද්‍යාත්මක
2. භූ විද්‍යාත්මක
3. ජල විද්‍යාත්මක

4. පාරිසරික විද්‍යාත්මක
5. මානව හැසිරීම්
6. සමාජ ආර්ථික
7. කෘෂිකාර්මික
8. වාරි මාර්ග කලමණාකරන
9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි.

මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

03.පිදුරුවැල්ලැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

3.1. භූගෝලීය (Geographical)තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුර හා නැගෙනහිර හා මධ්‍ය ප්‍රදේශ වල පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාශ 05ක් වන අඹන්පොල ගොවිජන සේවා බල ප්‍රදේශයේ වලලිය, වඳුරුස්ස, බොර වැව, නැකැති කුඹුක්වැව සහ පළාපත්වල ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුල පිදුරුවැල්ලැව එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. මෙම එල්ලංගාව හෙක්ටයාර 945.08 භූමි ප්‍රදේශයක් තුල පැතිරී ඇත.

ඒ අනුව එල්ලංගාව තුල ගමන් පහසුකම් ඇත. මෙම මාර්ගය දෙපස 20.5% ක් පමණ වනාන්තර පිහිටා ඇත. සෙසු ප්‍රදේශ නිවාස හා ගොඩ ඉඩම් ගෙවතු හේන් ගොඩ කුඹුරු දක්නට ලැබේ. කුඹුරු අක්කර ප්‍රමාණය 484.8 කි .ජනාවාස තුල ගොඩනැගිලි ඉදිකිරීම් භූමි ප්‍රමාණය අක්කර 807.7 ක් වන අතර මුඩු බිම අක්කර 401 කි.

මෙය විශාලතම එල්ලංගාවයි. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනි. තරමක් උස කඳු වලින් හා ලඳු කැලෑ වලින් සමන්විත තැනිතලා ස්වරූපයක් ගනී. මෙහි උන්නතාංශය මුහුදු මට්ටමේ සිට අඩි 280 පමණ මට්ටමේ පවති. පිදුරුවැල්ලැව එල්ලංගාව ඉහලින්ම පිහිටි වැව ඌරා වැව වන අතර ඌරා වැවට පිදුරුවැල්ලැව වැවෙන් ජලය ලබා දෙයි. පහලින්ම පිහිටි වැව පිදුරුවැල්ලැව වැවයි. පිදුරුවැල්ලැව වැවට අංශ හතරක් ඔස්සේ ජලය සපයයි. වගා බිම් ආරක්ෂා කර ගැනීමට අලි වැටවල් සවිකර ඇත. එල්ලංගාව තුල ඇති වනාරක්ෂිත ප්‍රදේශ වල ගොවීන් හේන් වගාව සිදුකරනු ලැබේ. හේන් වල පැපොල්, කැකිරි, තල යනාදී බෝග වගා කරනු ලබයි. එබැවින් දැඩි පාංශු බාදන තත්ත්වයක් දැකිය හැකිය.

3.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාව අක්කර 2362.7කින් යුක්තය. එහි 20.5% වණයෙන් ආවරණය වී ඇත. මෙම තත්වය නිසාම සතුන්ගේ හානි එල්ලංගාව තුල බහුල වී ඇත. ඉතිරි 80 % භූමිය තුල වැව් ගොඩ ඉඩම් හා කුඹුරු පිහිටා ඇත. එල්ලංගාව ගොවි පවුල් 611 වාසය කරයි.

සිතියම් අංක 06 පිදුරුවැල්ලෑව එල්ලංගාවේ පිහිටීම



ගොවීන් වී වගාව හරුණු විට ගොඩ බෝග වගාවේ නිරතව ඇත. වැව් ආසන්නයේ හේන් වගාව දක්නට ඇතත්, මේවායේ වගාව මහ කන්නයට පමණක් සීමා වේ. මෙම වගාවේ අස්වැන්න නෙලන තුරු සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට ගොවීන්ට සිදුවී ඇත. විශේෂයෙන් වන අලින්ගෙනි.

ගොඩ ඉඩම් වටා වගා ආරක්ෂිත අගල් යෙදීම ක්‍රමයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මෙය භූමි දර්ශණයේ සිදුවෙමින් පවතින නව වෙනස්වීමකි. තවද රිලවුන්, ඌරන්, ඉත්තෑවන් වැනි සතුන්ගෙන් වගාවට වන හානිය විශාලය. එල්ලංගාව තුල විශාල ගස් වර්ග දක්නට ලැබෙන අතර තේක්ක වැනි වටිනා ගස් වර්ග බහුලව දක්නට ලැබේ.

මෙම එල්ලංගාව අයත් ප්‍රාදේශීය කොට්ඨාසයේ පස පිළිබද සලකා බැලීමේදී පාංශු ඛාණ්ඩ තුනක් මෙම ප්‍රදේශයේ දැකිය හැකිය. දුර්වල ජල වහනයක් පවතින රතු දුඹුරු පස, රතු දුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පස හා දියළු පස එම පස් වර්ග වේ. ඒ අනුව මෙම එල්ලංගාවේ බහුලවම දක්නට ලැබෙන්නේ දුඹුරු පැහැති පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පසකි. එහෙත් කුඹුරු වල ලොම් පසක් පවතී.

සිතියම්අංක 07 පිදුරුවැල්ලෑව එල්ලංගාව ආශ්‍රිතව පස



ගොවීන් සමග කරනු ලබන සාකච්ඡාවේදී සඳහන් කරන ලද්දේ වී වගාවට සහ අනෙකුත් වගාවන්ට සුදුසු සාරවත් පසක් පවතින බවයි. එල්ලංගාව තුල ලදු කැළෑ සහිත කටු පදුරු දක්නට ලැබෙයි. එල්ලංගාව භූමි

ප්‍රදේශයෙන් 22%ක් පමණ කොටසක් වනාන්තර වලට වෙන්ව ඇත. කුඹුරු ලෙස 17.75% ක ප්‍රමාණයක්ද 16.9% පමණ මුඩු බිම් ද හඳුනා ගත හැක.

3.3.ජලවිද්‍යාත්මක (Hydrological) තොරතුරු

මෙම එල්ලංගාව මී ඔය ගංගා ද්‍රෝණිය තුල පිහිටා ඇති අතර මී ඔය ගංගා ද්‍රොණිය උප ද්‍රෝණි අටකට වෙන් කර ඇත. පිදුරුවැල්ලැව එල්ලංගාව එහි තුන්වන උප ද්‍රෝණියේ පිහිටා ඇත.

සිතියම් අංක 08- මී ඔය ද්‍රෝණිය තුල බොරවැව එල්ලංගාවේ පිහිටීම



මුලාශ්‍රය දේශගුණ සුහුරු ව්‍යාපෘතිය-ජලකළමනාකරණ අංශය

පිදුරුවැල්ලැව එල්ලංගාව අයත් භූමි ප්‍රදේශය තැනිතලා භූමියක් වන අතර ජලවහන රටාව පිළිබඳ සලකා බැලීමේදී මී ඔය ප්‍රධාන තැනක් ගනී. එහි ශාඛාවන හිතෝ ඇල හා අඹගම්මන ඇල ජල වහනයේදී විශේෂ වේ. එමෙන්ම කුඩා හා මහා පරිමාණයේ වැව් රාශියක් ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතී. එල්ලංගාව භූමි ප්‍රමාණයෙන් ජල මුලාශ්‍ර වල පැතිරීම අක්කර 249.4 කි.

එල්ලංගාව විශාලතම වැව පිදුරුවැල්ලැව වන අතර ජල ධාරා විසිතුනක් ඔස්සේ පෝෂණය වේ. ඒවායේ වැසි කාලයට විශාල ජල ප්‍රමාණයක් ගලා බසී. ලැබෙන වර්ෂාපතන රටාවන් අනුව එල්ලංගාව ජලාශ වල ජල ධාරිතාවය උච්චාවචනය වේ. එල්ලංගාවට අයත් මුළු වැව් වල ජල ධාරිතාවය අක්කර අඩි 995.8.ක් වන අතර පෝෂිත වගා භූමි ප්‍රමාණය ලැබෙන වර්ෂාපතන තත්වයන් අනුව මෙම ධාරිතාවය වෙනස් වේ. මෙම කොට්ඨාසයට වර්ෂාව ලැබෙනුයේ මෝසම් හා සංවහන වර්ෂා මගිනි. ඊසාන දිග මෝසම් වර්ෂාව මගින්

සැප්තැම්බර් මස සිට පෙබරවාරි දක්වා වැඩි වර්ෂාපතනයක් ලැබෙන අතර, සංවහන වර්ෂාව මාර්තු අප්‍රේල් මාස වලදි ලැබේ.

මෙම එල්ලංගාවට අයත් වැව් සඳහා වාර්ෂිකව හා මාසිකව ලැබෙන වර්ෂාපතනය ගණනය කිරීමේ දී මධ්‍යස්ථාන තුනකින් මෙම ගණනය කිරීම සිදු කරනු ලබයි.

එල්ලංගාවට අයත් ප්‍රතිසංස්කරණය කරනු ලබන වැව් 25 සඳහා වාර්ෂික හා මාසික වර්ෂාපතනය ගණනය කිරිම මැදියාව වැව මධ්‍යස්ථානය මගින් ද අතරගල්ල මධ්‍යස්ථානය මගින් ඉහිණිමිටිය මධ්‍යස්ථානය මගින් ද සිදු කරනු ලබයි.

ප්‍රස්තාර අංක 02 - මැදියාව මධ්‍යස්තානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම



ප්‍රස්තාර අංක 03 - අතරගල්ල මධ්‍යස්තානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම



ප්‍රස්තාර අංක 04- ඉහිනිමිටිය මධ්‍යස්තානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම



ඉහත දත්තයන්ට අනුව මැදියාව මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය මි.මී.1473ක් වන අතර ඊසාන දිග මෝසමේ මුල් කාලපරිච්ඡේදය හා අන්තර් මෝසම් කාල සීමාවන් තුල වාර්ෂික වර්ෂාපතනය ඉහල කාල සීමාවක් වේ.

එමෙන්ම අතරගල්ල මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය මි.මී.1091 වෙනස්වීම අන්තර් මෝසම් කාලසීමාව වාර්ෂික වර්ෂාපතනය ඉහල කාලෂීමාවක් වේ. ඉඟිනිමිටිය මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම මි.මී.1209ක් වන අතර ඊසාන දිග මෝසම් කාලපරිච්ඡේදය හා අන්තර් මෝසම් කාල සීමා වර්ෂාපතනය ඉහල අගයක් ගනී.මෙම දත්ත විශ්ලේෂණය එල්ලංගාවට සාමාන්‍ය වැස්සක් ලැබෙන බව කිවහැකිය. මෙම තත්වයන් සැලකිල්ළට ගෙන සදුසු වගා සැලැස්මක් තීරණය කල යුතුය.

මෙම කලාපයේ වියළි කාලගුණික තත්ත්වයක් දක්නට ලැබෙන අතර වියළී වාර්ෂික උෂ්නත්ව තත්ත්වයන් පහත සඳහන් පරිදි වේ.

වගු අංක 06 - වාර්ෂික උෂ්ණත්ව තත්ත්වයන්

මාසය	වර්ෂය			
	2020	2021	2022	2023
ජනවාරි	33.4	35.1	34.6	29.2
පෙබරවාරි	33.7	32.5	32.1	30.5
මාර්තු	35.5	34.4	30.7	33.1
අප්‍රේල්	34.8	33.0	31.6	34.4
මැයි	34.7	32.7	32.6	33.1
ජූනි	34.4	32.7	33.0	33.4

ජූලි	34.7	33.3	33.9	33.2
අගෝස්තු	34.5	34.8	35.3	34.9
සැප්තැම්බර්	33.9	34.1	33.6	32.2
ඔක්තෝබර්	33.7	31.3	31.9	31.7
නොවැම්බර්	33.8	30.1	30.6	31.3
දෙසැම්බර්	34.6	31.1	32.2	29.8

ප්‍රදේශයේ වාර්ෂික උෂ්ණත්ව තත්වයන් සැලකීමේ දී වර්ෂය පුරාවට වියළි කාලගුණ තත්ත්වයක් දක්නට ලැබේ. ජනවාරි මාසයේ පමණක් අඩු උෂ්ණත්වයක් පෙන්නුම් කරයි. උෂ්ණත්වයට අදාළ දත්ත සැලැකිල්ලට ගෙන ද වගාවන් සැලසුම් කල හැක.

3.4. පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

පිදුරුවැල්ලෑව එල්ලංගාව අවට පිහිටා ඇත්තේ වියළි කටුපඳුරු සහිත ළඳු කැලෑ බහුලව දැකිය හැකි තැනිතලා ප්‍රදේශයක්තුලය. මෙම ප්‍රදේශයේ පිහිටි මෙහි විශාල පරිමාණයේ ශාක වර්ග වශයෙන් සියඹලා, තේක්ක, අඹ, දිවුල්, කරඳ හා කුඹුක් වැනි ශාක විශේෂ බහුලව පවතී. පරිසරයේ පොල්වතු දැකිය හැකි අතර එය ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගයක්ද වේ.

මීට අමතරව වියළි කලාපයට විශේෂ වූ උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඩියා, අහර කුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද එල්ලංගාව තුල ජීවත් වේ. ප්‍රදේශයේ වගාවන් ආරක්ෂා කර ගැනීම හා නිවෙස් වල ආරක්ෂාව සඳහා විදුලි වැටවල් ගසා ඇත. රිලවුන්, මොනරුන්, ඌරන් වැනි සතුන් වගාවන් ආශ්‍රිතයට ඇතුල් වීමේදී ඔවුන්ට විදුලි සැර වැදීමෙන් අනතුරු බහුලව සිදුවන අතර ඇතැම් සතුන්ගේ ජීවිත පවා විනාශ වේ. එමෙන්ම වනාන්තර විනාශය නිසා ජල පෝෂක ප්‍රදේශ විනාශ වේ මෙය පරිසරයේ තිරසර පැවැත්මට සෘජුව බලපාන හේතුවකි.

මෙම එල්ලංගා පද්ධතිය තුල වැව් 41ක් පවතින අතර වැව් 25 ක් දේශගුණ සුහුරු කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලදි. ගල වැව සම්පූර්ණයෙන්ම වන සංරක්ෂිත කලාපයට අයත් ප්‍රතිසංස්කරනය නොකරන ලද වැවක් ලෙස සදහන් කල හැක. වන සංරක්ෂණ කලාපයට අයත් වන්නේ හෙක්ටයාර 54 කින් යුත් කොසැත්තැවප්‍රදේශයයි. පහල තංතිරියාව, මිල්ලගහ වැව, පිදුරුවැල්ලැව වන සංරක්ෂණ කලාපයේ සීමාවට ආසන්නයේ පිහිටා ඇත.

එල්ලංගාව ආශ්‍රිතව පරිසර පද්ධතිය මානව ක්‍රියාකරකම් හේතුවෙන් යම් පරිසර හානියක් සිදුවෙමින් පවතී.

නාශ කර

වැව් ඉස්මත්තේ පෝෂක ප්‍රදේශයේ සිදුවන අනවසර හේන් වගාව නිසා (පිදුරුවැල්ලැව වැව ,මිල්ල ගහ වැව යන ආදි වැව්) නිසා පාංශු ඛාදනය අධික වී ඇත. පිදුරුවැල්ලැව වැව ඉස්මත්තේ තිබූ ඉදිගස් ගොවීන් විසින් ගිණි තබා විනාශ කර ඇත.ඒ තුලින් වැවට සහ එල්ලංගා පරිසර පද්ධතියේ වෘක්ෂලතාවන්ට හා සතුන්ට වූ හානිය විශාලය. ජල පෝෂක ප්‍රදේශ හානියට පත්ව ඇත. පරිසරයේ සමතුලිතතාවය නැති වී ඇත. විශේෂයෙන්ම හේන් වගාව නිසා පසේ ජලය උරා ගැනීමේ හැකියාව අඩු වී ඇති අතර ලැබෙන ජලය පස් ද සෝදා ගෙන පහලට ගමන් කරයි. මේ නිසා භූගත ජල මට්ටමද පහල ගොස් ඇත. එසේම විද්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව සිදු කරන මෙම අනවසර හේන් වගාවේ සී සෑම මගින් බිම් සකස් කිරීම නිසා වර්ෂාවත් සමඟ පස් සෝදාගෙන විත් ජලමාර්ග වල හා වැව් වල රොන්මඩ තැන්පත් වේ.

වැවට ඉඩම් ඛාදනය වී වතුර ගලා ඒම තුළින් වැවේ ජල ධාරිතාවය අඩුවීමට එය හේතු වේ වැසි කාලයට වැව පිටාර ගලන අතර වැවේ අල්ලන ජල ධාරිතාවය අඩුවේ. වියළි කාලයට (මහ කන්නයට) වගා කිරීමට ප්‍රමාණවත් ජලය නොමැති වේ.

එමෙන්ම උඩ බෝගහ වැව,වදුරුස්ස වැව , හිරියාල වැව යන වැව්වල වැව් ප්‍රතිසංස්කරණයේදී කපා ඉවත් කරන ලද පස් වැසි කාලයේදී වැවට සෝදා ඒම තුළින් පාංශු ඛාදනය සිදුවේ. නමුත්, මෙම එක දේශික ශාක වදවී යාමේ තර්ජනයක් පවතී.විශාල වශයෙන් ආක්‍රමනික ශාක ව්‍යප්ත වීමක් දක්නට ලැබේ.

බොහෝ වැව් වල ආක්‍රමණික ජලජ ශාක දක්නට ලැබූ අතර ජපන් ජබර,*Eichhorniacrassipes*, උඩ වලලිය, උඩ බෝගහ වැව, පාලුගම, වල් පාලුව, කරුවලගස්වැව යන වැව්ද ආක්‍රමණික ශාකයක් වන විල කටු (වලලිය) වැවේද වැසි ඇති බව දක්නට ලැබුණි.

මෙම ආක්‍රමණික ශාක විනාශ කිරීම පරිසර අංශයේ විද්‍යා නිලධාරීන්ගේ උපදෙස් මත සිදුවිය යුතු අතර ඒ වෙනුවට වන වගාවක්ද ආරම්භ කල යුතු වේ. විශේෂයෙන්ම නෙළුම් මල් වැනි මල් ජලාශයේ වර්ධනය කිරීම තුලින්

ප්‍රදේශයේ ගොවීන්ට ආර්ථික වාසිද අත්පත් කර ගත හැකි වේ. මෙම ආක්‍රමණික ශාක සීග්‍ර ලෙස ව්‍යාප්තියට හේතුව ගොවි සංවිධානවල විධිමත්නඩත්තු ක්‍රමවේදයක් නොමැති වීම බව පැහැදිලි වේ. එල්ලංගාව කළමණාකරන කමිටුව හරහාකඩිනමින් පරිසරයට බලපාන අහිතකර බලපෑම් පිළිබඳව තීරණයක් නොගත හොත් එය පරිසරයේ තිරසර පැවැත්මට මෙය සෘජුව බලපානු ඇත.

3.5. එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු

පිදුරුවැල්ලැව එල්ලංගාව පිහිටා ඇත්තේ වියළි කාලගුණයක් සහිත ප්‍රදේශයක් තුලය. මෙම එල්ලංගාව තුළ ජීවත් වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝප මාර්ගය ගොවිතැනයි. මුළු ජනගහනයෙන් 70% පමණ රැකියා නියුක්ත වන අතර ජනගහනයෙන් 80% පමණම කෘෂිකර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනී. ඒ අනුව ප්‍රධානජීවනෝප මාර්ගය ලෙස ගොඩ හා මඩ ගොවිතැන හඳුනාගත හැක. සාමාන්‍ය ජනගහනයක් පවතින මෙම ජනගහනයෙන් 50%ක් කාන්තා ජනගහනය වේ.

හෙක් 945.08 වන එල්ලංගාව තුල කුඹුරු අක්කර 446ක් පමණ පිහිටා තිබෙන අතර ගොවි පවුල් 611ක් කෘෂිකාර්මික කටයුතු වල නියලේ. මෙම ප්‍රමාණය සම්පූර්ණයෙන් වගා කිරීම වාර්ෂික වර්ෂාපතන රටාව අනුව වෙනස් වේ. වර්ෂාපතන රටාව අනුව එල්ලංගාවට ලැබෙන ජලය ප්‍රමාණවත් නොවීම එයට හේතුව වේ.

එල්ලංගාව තුල දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමි ප්‍රමාණය හෙක්ටයාර 54 පමණ වන අතර ඉන් කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර 20ක් පමණ යොදා ගෙන ඇති බව ප්‍රදේශයේ ගොවීන් දන්වන ලදි.

එමෙන්ම අතිරේක බෝග ලෙස පොල්,කෙසෙල් පැපොල් වැනි දෑ හේන් වල වගා කිරීමට ගොවි ජනතාව වැඩි කැමැත්තක් දැක්වුවද වන සතුන්ගෙන් වන හානි හේතුවෙන් ගොවි ජනතාව ඒවැනි වගාවන්ගෙන් ඇත්වන බවක් දක්නට ලැබේ. නිරන්තරයෙන් හේන් ආශ්‍රිතව වගා කර තිබූ අතිරේක බෝග වගාවන් වන සතුන් විසින් හානියට පත්කරන බැවින්, ප්‍රදේශවාසීන් වගාවන් කිරීමට මැලිකමක් දක්වන වන බව ගොවි නියෝජිතයින් දන්වන ලදි.

කෘෂිකර්මය හැරුණු විට සත්ව පාලනය වැනි තාවකාලික රැකියාවල නිරතවේ. ඇතැම් පුද්ගලයන් ප්‍රදේශයෙන් පිටතට ගොස් රැකියාවල නිරතවේ. තවද එල්ලංගාව පිහිටි වැව් ආශ්‍රිතව සුළුවශයෙන් ධීවර කටයුතු සහ ගව පාලනය වැනි කටයුතු ද සිදුකරනු ලැබේ. මීටඅමතරව ස්වයං රැකියාවල නියුක්ත පිරිසක්ද ප්‍රදේශය පුරා ව්‍යාප්තව ජීවත් වන අතර නිම් ඇඳුම් කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වඩු කර්මාන්තය, පොල් කර්මාන්තය වැනි කර්මාන්ත ද ජීවනෝපාය ක්‍රම ලෙස භාවිතා කරයි. එල්ලංගාව අහිතකර මානව ජීවනෝපය ක්‍රම හේතුවෙන් ජල පෝෂක ප්‍රදේශ දිනේන දින විනාශයට ලක්වීම විශාල ගැටළුවකි. ප්‍රදේශ තුළ හේන් වගාව සඳහා වනාන්තර විනාශ වීම නිසා පාංශු ඛාදනය දිනෙන දින ඉහළ යමින් පවතී.

3.6. සමාජ ආර්ථික තොරතුරු

පිදුරුවැල්ලැව වැවෙහි නම පටබැඳිම සම්බන්ධයෙන් ජනප්‍රවාදයෙහි විවිධ කතා පැතිර ඇත. දුටුගැමුණු රජුගේ සහෝදරයෙකු වන පැරණි යාපහුව රාජධානිය පැවති සමයේදී රජකම් කළ සද්ධාතිස්ස රජතුමාවිසින්

මෙම වැව කරවූ බව අතීත කතා වල සඳහන් වේ. වැව ඉදිකරමින් සිටියදී දුටුගැමුණු රජුට අසනීප වී ඇති අතර ඒ වන විටත් වැවේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වූ බවත් වැවේ ඉදි නොකළ කොටස (වැවේ කඩක්කරය) පිදුරු සමග වැලි මිශ්‍ර කර වසා වැව ඉදිකිරීම් අවසන් බව දුටු ගැමුණු රජුට පෙන්වූ බවත් ඒ හේතුවෙන් මෙම වැවට පිදුරුවැල්ලැව යන නම පටබැඳුන බවත් ජනප්‍රවාදයෙහි ප්‍රකට කතාවක් වේ.

මෙම ප්‍රදේශයේ ක්‍රම ක්‍රමයෙන් ජනගහන වර්ධනය වූ බවත් එම ජනගහනය අද දක්වා මෙම වැව් අමුණු යොදාගෙන කෘෂිකාර්මික කටයුතුවල නිරත වී ඇත. කුඹුරු අක්කර 446.549ක් ප්‍රදේශය වගාවට යොදාගෙන ඇති අතර ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි.

අතිරේක බෝග වගාව යටතේ බඩ ඉරිඟු, රට කජු, ලොකු ළූණු, පැණි කොමඩු වැනි බෝග වර්ග වගා කරන ලබයි. නිෂ්පාදනයන් වෙළඳ පොළවලට බෙදා හරින ලබයි.

එල්ලංගාව අයත් වන ග්‍රාම නිලධාරී වසම් සමස්ත ජනගහනය 4023 පමණ වන අතර ඉන් 50.11% (2016) ගැහැණු ද 49.88%(2007) පිරිමි ද වේ. මේ අතරින් වයස අවුරුදු 15-19ත් අතර ජනගහනය 533ක් වන අතර වයස අවුරුදු 60-69ත් අතර ජනගහනය 332ක් වේ. වයස අවුරුදු 70 හා ඊට ඉහළ ජනගහනය 128 කි. මෙම ප්‍රදේශයේ සමස්ථ ජනගහනයෙන් 99% පමණම සිංහල බෞද්ධ වේ.

ප්‍රස්තාර අංක 05-වයස් බාණ්ඩ අනුව එල්ලංගාවේ ජනගහනය -පිරිමි



ප්‍රස්තාර අංක 06-වයස් බාණ්ඩ අනුව එල්ලංගාවේ ජනගහනය -ගැහැණු



ඒ අනුව ජනගහනයෙන් 60% වැඩි කොටසක් 20-59 වැඩ කරන වයසේ ජනගහනය වන අතර වැඩිහිටි ජනගහනය අඩුමට්ටමක පවතී. මෙම ප්‍රදේශයේ ජනතාවගේ අධ්‍යාපන මට්ටම සැලකූ විට වයස අවුරුදු පහට වැඩි ජනගහනයෙන් 0.5% පමණ පිරිසක් පාසල් නොගිය බාණ්ඩයට අයත්වන අතර අනෙකුත් සියලු දෙනා යම් කිසි අධ්‍යාපනයක් ලබා තිබේ. ඒ අතරින් 35% පමණ අ.පො.ස.(සා.පෙළ) හා ඊට ඉහළ අධ්‍යාපන මට්ටමක් ලබා තිබේ. ජනගහනයෙන් 30.95% පමණ අ.පො.ස.(සා.පෙළ) මට්ටම දක්වා අධ්‍යාපනය ලබා තිබේ.

ප්‍රස්තාර අංක 07-ජනගහනය අනුව අධ්‍යාපන මට්ටම



එල්ලංගාව තුල වැඩකළ හැකි ජනගහනයෙන් 70%ක් සේවා නියුක්ත වන අතර සේවා වියුක්තිය 30% පමණ වේ. ඒ අතරින් සේවා නියුක්ත අංශ පහත පරිදි විහිදී ගොස් ඇත.

ප්‍රස්තාර අංක 08 - රැකියා නියුක්තිය



ග්‍රාම නිලධාරි වසම් පහ තුල රාජ්‍ය අංශයේ රැකියාවල 452ක් හා පෞද්ගලික අංශයේ රැකියා වල 412ක්ද කෘෂිකාර්මික කටයුතු වල 1091ක් හා විදේශගතව නියුතු පිරිස 82ක් වේ. මෙයින් පෙන්නුම් කෙරෙනුයේ එල්ලංගාවේ වැඩි ප්‍රතිශතයක් කෘෂිකාර්මික කටයුතු වල නියුතු වන බවයි. ජනගහනයෙන් වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටි පිරිස අඩු බව පෙන්නුම් කෙරේ. එල්ලංගාවේ ජනතාවගේ ආර්ථික තත්ත්වය මෙන්ම සමාජ තත්ත්වයද මධ්‍යස්තව පවතී.

3.7. එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් (Constructions) කටයුතු පිළිබඳ

තොරතුරු එල්ලංගාව තුල විශේෂ ඉදිකිරීම් දක්නට නැත. පදිංචිය සඳහා නිවාස වෙළඳාම සඳහා ගොඩනැගිලි සුලු වශයෙන්ද ඉදිවෙමින් පවතී .මීට අමතරව වගාව සඳහා සිදුකෙරෙමින් පවතින විවිධ ඉදිකිරීම් දක්නට ලැබේ. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතල බවට පත්ව ඇත. මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. බොහෝ වගා බිම්වල උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මෙම ප්‍රශ්නය ගැන විශේෂ අවධයානයක් යොමු කරන අතර 2020-2024 කාල සීමාවන් තුල දී අලි වැටවල් ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය සිදු කර ඇත. ඉදිකිරීම් අතරින් මේ දින වල විශේෂත්වයක් ගන්නේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන වාරි කර්මාන්ත සම්බන්ධයෙනි. කෘෂි ළිං, වැව් සොරොව්, කෘෂි ළිං, කෘෂි මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය වෙමින් පවතී. දැනට එක් ළිදක් පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ එල්ලංගාවට ඉදිකර ඇති අතර නව ළිං ඉදිකිරීමට අපේක්ෂිතය. ප්‍රදේශය පුරා ඇති මුළු කෘෂි ළිං ගණන 67කි. තවද නිවාස හා ගොඩනැගිලි වලට අමතරව විශේෂයෙන් ඉදිකර ඇති ගොඩනැගිලි වනුයේ වදුරැස්ස සාරධ පෙර පාසලව, වලලිය සමගි පෙර පාසල, නැකැති කුඹුක්වැව රෝස් බින් පෙර පාසල, වදුරැස්ස ප්‍රජා මුල බල මණ්ඩලය, වලලිය ප්‍රජා මණ්ඩලය පන්සල්, පාසල් ආදි විශේෂ පොදු ස්ථානය. එල්ලංගාව් පිහිටි වැව් 27 අතරින් 25ක් පුණරුත්ථාපනය කෙරේ. වැව් බැම්ම, වාණ, සොරෙව්ව, රොන් මඩ ඉවත් කිරීම් වැනි ඉදිකිරීම් කටයුතු මේ දින වල නිමවෙමින් පවතින අතර එල්ලංගාව යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් 25 ගොවි ජනතාවට භාර දී ඇත.

3.8. එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා පිළිබඳ තොරතුරු

ප්‍රදේශයේ දුඹුරු කැලෑ වැලි පසකින් සමන්විතය. සියලු වැව් ඉස්මත්ත හේන් වගාව ද සැලකිය යුතු

කෙසෙල් වගාවක්

මට්ටමකින් සිදුකරනු ලබන අතර හේන් වගාවද‍ද සිදුකරනු ලබයි. ඒ අනුව පදිංචිය ගොඩ ඉඩම් වගාව හා හේන පවතින්නේ එකම පද්ධතියක් ලෙසිනි. එල්ලංගාව තුල ප්‍රතිසංස්කරණය කරන ලද වැව් 25ක් පවතී. මෙයට අමතරව ප්‍රතිසංස්කරණය නොකරන ලද කුඩා වැව් 16ක් පමණ ඇත.

අතිරේක බෝග වගාව යටතේ බඩ ඉරිගු, රට කජු, ලොකු ළූණු, පැණි කොමඩු වැනි බෝග වර්ග වගා කරන අතර බඩ ඉරිගු යල කන්නයේ හෙක්ටයාර 47ක වගා කර මෙට්‍රික් ටොන් 142 ද මහ කන්නයේ හෙක්ටයාර 38ක වගා කර මෙට්‍රික් ටොන් 114 රටකජු යල කන්නයේ හෙක්ටයාර 57ක් වගා කර මෙට්‍රික් ටොන් 97ක් ද පැණි කොමඩු හෙක්ටයාර 24ක වගා කර මෙට්‍රික් ටොන් 146ක් ද නිෂ්පාදනය කරනු ලබයි.

එල්ලංගාවේ සෙසු කෘෂිකාර්මික කටයුතු පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී කුඹුරු වගාව පිළිබඳව පහත සඳහන් වගුව පිළිබඳ තොරතුරු වැදගත් වේ.

වගු අංක 07 - වගාකල හැකි කුඹුරු ප්‍රමාණය

වගා කන්නය	වගාකල හැකි කුඹුරු ප්‍රමාණය	වගාකල කුඹුරු ප්‍රමාණය
2020/21 මහ කන්නය	He 180	He 190
2021යල	He 180	He 76

මූලාශ්‍රය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව අඹන්පොල

ඉහත වගුව අනුව මහ කන්නයේ දී සමස්ථ කුඹුරු ප්‍රමාණය වගා කර ඇති බව පෙනේ. එය යල කන්නයේ දී He 76 දක්වා පහල බැස ඇත. පසුගිය දා පැවති හරස්කඩ චාරිකාවේ දී මේ බව හොඳින්ම තහවුරු විය. වී වගාවට අමතරව වෙනත් බහු වාර්ෂික භෝග වගාවන් පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී එල්ලංගාව තුල බඩ ඉරිගු ,රට කජු ලොකු ලූණු පැණි කොමඩු හා පොල් වගාවද සිදුකරනු ලබන අතර මීට අමතරව TOMEJC පොල් සුළු වශයෙන් දක්නට ලැබේ. අලීන්ගෙන් වන හානිය ඉහලය.
ඒ අනුව වගාවන් රැකගැනීම සඳහා ගොවීන් මහත් වෙහෙසක් දරයි. තම වගා ඉඩම් වටා විශාල අගල් කැපීමටත් ආරක්ෂිත අලිවැට යෙදීමටත් ගොවීන් පෙළඹී ඇත. මෙම තත්ත්වය ප්‍රදේශය පුරා ක්‍රමයෙන් ව්‍යාප්ත වන බවක් පෙනේ. ප්‍රදේශයේ පවතින පසේ ස්වභාවන් හා හොඳින් ලැබෙන සූර්ය රශ්මිය උපයෝගී කර ගනිමින් ගොඩ ඉඩම්වල සුදුසු වගාවන් ආරම්භ කිරීමට හැකිය.
ඉහත වගුව පසුගිය වසර 2 තුල සියලුම වැව් යටතේ මහ කන්නයේ වගා කර ඇත්තේ 2021/22 මහ කන්නයේ පමණි. එසේම යල කන්නයේ අතිරේක ආහාර බෝග වගාවක් සිදු කරන අතර අතිරේක බෝග වගාවද මුලු වගා බිම් පරිමාණයේම සිදු කර නැත. තවද වර්ෂාව ප්‍රමාණවත් නොවීම, මනා ජල කලමණාකරනයක් නොමැති වීම සහ එල්ලංගාවේ ජල පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවක් සිටීම නිසා සෑම කන්නයක්ම, අඛණ්ඩව වගා කිරීමට නොහැකි වී ඇත

මෙම එල්ලංගා පද්ධතියට අදාල ප්‍රදේශයට යල සහ මහ කන්න වලදී වර්ෂාපතනය ලැබෙන අතර එය මි.මි 950 - 1350 ට වඩා අඩු අගයකි.

මහ කන්නයේදී එල්ලංගා පද්ධතියේ වැව් වලට ලැබෙන ජලය භාවිතා කර වී වගාව සිදු කරනඅතර එහි ගෙවතු ආශ්‍රිතව මෙන්ම ගොඩ ඉඩම්වල හේන් වගාව සිදුකරනු ලබයි. එම ගොඩ ඉඩම්වල එළවලු වගාව මෙන්ම ස්ථිර බෝග ලෙස අඹ,පොල්,කෙසෙල් ඇතුළුව අනෙකුත් පළතුරු වගාවන්ද වගා කරනු බව දක්නට ලැබේ. තවද, විශේෂයෙන්ම මහ කන්නයේදී ගොඩ ඉඩම්වල මුං ඇට, කව්පි, උඳු, රටකජු, තල, මිරිස්, බඩ ඉරිගු යනාදී වගාවන්ද දක්නට ලැබේ.

යල කන්නයේදී වැව් සඳහා ලැබෙන ජලය ප්‍රමාණවත් නොවීම නිසා වී වගාව ඉතාමත් අඩුවෙන් සිදුකරන අතර සමහර ගොවීන් විසින් මුං ඇට, රටකජු, කවුපි, උඳු, වැනි මාංශ බෝග එම කුඹුරු වල සුළු වශයෙන් වගා කරනු ලබයි. ඒ අනුව පහත ලෙස වගා කන්න සැලසුම් කර ගත හැකිය.

වගු අංක 08- වගා කන්න

කන්නය	වගාව ආරම්භක දිනය
පලමු මැද කන්නය	ජනවාරි 31
දෙවැනි මැද කන්නය	අගෝස්තු 01
මහ කන්නය	ඔක්තෝබර් 16
යල කන්නය	අප්‍රේල් 20

ඉහත සදහන් වගා කන්න සදහා යෝජිත බෝග වගා රටාවන් පහත පරිදි හදුන්වා දිය හැකිය.

වගු අංක 09- යෝජිත බෝග රටා

අංකය	වගා රටා
1.	මහ කන්නයේ 100% වී,යල කන්නයේ 50% වී සහ 50% අනෙකුත් ක්ෂේත්‍ර භෝග
2.	මහ කන්නයේ 100% වී,යල කන්නයේ 40% වී සහ 60% අනෙකුත් ක්ෂේත්‍ර භෝග.
3.	මහ කන්නය 100% වී,යල කන්නයේ 40% වී සහ 50% OFC; මැද කන්නය 1 25% අනෙකුත් ක්ෂේත්‍ර භෝග.
4.	මහ කන්නයේ 100% වී, යල කන්නයේ 40% වී සහ 50% අනෙකුත් ක්ෂේත්‍ර භෝ,මැද කන්නය 1 25% OFC; මැද කන්නය 2 25% අනෙකුත් ක්ෂේත්‍ර භෝග.
5.	මහ කන්නය 100% වී,යල කන්නය 100% අනෙකුත් ක්ෂේත්‍ර භෝගමැද කන්නය 1 25% OFC,මැද කන්නය 2 25% අනෙකුත් ක්ෂේත්‍රභෝග

තවද මෙම එල්ලංගා පද්ධතිය තුල ගවයින් නිදැල්ලේ හැසිරෙන බවටත් ගවපාලනය අවිධිමත් ලෙස සිදුකරනු ලබන බවත් පැහැදිලිය. එබැවින් විදිමත් ගව පාලන සැලැස්මකට අනුව කිරි ගව පාලනය ශක්තිමත් කර කිරි නිෂ්පාදනය වැඩි දියුණු කල යුතුව ඇත.

පිදුරුවැල්ලැව එල්ලංගා පද්ධතියේ දිගුකාලීන තිරසාර සාර්ථකත්වය උදෙසා දේශගුණ සුහුරු කෘෂිකාර්මික සැලැස්මට තිරසාර කෘෂිකාර්මික තාක්‍ෂණය හා ජල පෝෂක කළමනාකරණය මෙන්ම දේශගුණ බලපෑම් වලට ඔරොත්තු දිය හැකි සාර්ථකත්වයෙන් යුත් මුල ධර්ම හා ඒකාබද්ධ කිරීම කල යුතුව ඇත. තවද දිගුකාලින සාර්ථකත්වය උදෙසා එහි පාර්ශවකරුවන් අතර සහයෝගිතාව වර්ධනය මෙන්ම ඔවුනොවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ප්‍රමුඛතාවය අනුව කටයුතු සැලසුම් සකස් කල යුතුය.

2024 වර්ෂයේදී එල්ලංගා මට්ටමින් බීජ බෙදා දුන් අතර වැඩි බීජ අස්වැන්න වෙනත් එල්ලංගාවන්ට ලබාදීමට සැලසුම් කර ඇත. වගා සැලැස්මක්ද සකස් කර ඇති අතර එය සාර්ථක වුවහොත් මෙම එල්ලංගාවේ වී සහ අතිරේක බෝග නිෂ්පාදන ඉහල යාමට හේතුවේ.

තවද, කෘෂි ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ සියළු අංග වලින් සමන්විත ආදර්ශ ගම්මාන වැඩසටහන එල්ලංගාව තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.ඒ සඳහා දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ බීජ මෙන්ම බීජ වප්කර, නිෂ්පාදිත උපකරණ (මිරිස්,කහ,කජු,මඤ්ඤොක්කා) වැනි උපකරණ ලබාදීමට අපේක්ෂිතය. සූර්යයබල පැනල, ජල පොම්ප ප්‍රදේශයේ අවශ්‍යතාවය අනුව ලබාදීමට යෝජනා කර ඇත.

කෘෂිකර්ම දෙපර්තමේන්තුවේ, ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේ සහ ව්‍යාපෘතිය යටතේ නියුක්ත කෘෂි නිලධාරින් කලාප මට්ටමෙන් ගොවීන් සමග ඒකාබද්ධව කෘෂිකාර්මික ඉදිරි සැලස්මට අනුව වැඩ කටයුතු සිදුකරයි.

3.8.1. එල්ලංගා පද්ධතියේ කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිකිරීම හා බෝග රටා පිළිබද සංවර්ධන යෝජනා.

පිදුරුවැල්ලාව එල්ලංගා පද්ධතිය වැව් 25කින් සමන්විතය. එහි ජල පෝෂක ප්‍රදේශයගොඩ ඉඩම් -294(ha) හෙක් මඩ ඉඩම් කුඹුරු-275(ha)පමණ වන අතර ගොඩ ඉඩම් ප්‍රමාණය හෙක් 296කි. මෙහි වී වගාව, ගෙවතු වගාව හා හේන් වගාවද සිදුකරනු ලබයි. මෙයට ගොවි පවුල් 611ක් පමණ අයත්ය. මෙම එල්ලංගා පද්ධතියට අදාල ප්‍රදේශයට යල සහ මහ කන්න වලදී වර්ෂාපතනය ලැබෙන අතර එය මි.මි. 950 ට වඩා අඩු අගයකි. මෙහි පස විශාල වශයෙන් රතු දුඹුරු වන අතර එහි සමහර ප්‍රදේශ වල වැලි මිශ්‍ර ලෝම පස්ද දක්නට ලැබේ. තවද මෙම එල්ලංගා පද්ධතියට යාබදව වන සංරක්ෂණයට අයත් කැලෑ ප්‍රදේශයක්ද දක්නට ලැබේ.

පිදුරුවැල්ලැව එල්ලංගා පද්ධතියේ දිගුකාලීන තිරසාර සාර්ථකත්වය උදෙසා දේශගුණ සුහුරු කෘෂිකාර්මික සැලැස්මට තිරසාර කෘෂිකාර්මික තාක්‍ෂණය හා ජල පෝෂක කළමනාකරණය මෙන්ම දේශගුණ බලපෑම් වලට ඔරොත්තු දිය හැකි සාර්ථකත්වයෙන් යුත් මුල ධර්ම හා ඒකාබද්ධ කිරීම කල යුතුව ඇත. තවද දිගුකාලින සාර්ථකත්වය උදෙසා එහි පාර්ශවකරුවන් අතර සහයෝගිතාව වර්ධනය මෙන්ම ඔවුනොවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ප්‍රමුඛතාවය අනුව කටයුතු සැලසුම් සකස් කල යුතුය.

01. දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා සුදුසු දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හඳුනා ගැනීම. මෙම ක්‍රියාකාරකම් සඳහා බෝග විවිධාංගිකරණය, අවම බිම් සැකැසීම, කෘෂි වන වගාව පිහිටුවීම, හා පාංශු ජලය කාර්යක්ෂමව භාවිතා කිරීම, පාංශු පෝෂකත්වය වැඩි කිරීම පාංශු සංරක්ෂණය කිරීම හා ජල සම්පත් මනාව ආරක්ෂා කර ගැනීම කල යුතුය.

02. කෘෂිකාර්මික බෝග රටාවන් සඳහා ජල භාවිතය තිරසාරව තහවුරු කිරීම සඳහා දේශගුණ සුහුරු කෘෂිකාර්මික සැලැස්ම සඳහාවූ ඒකාබද්ධ ජල කළමනාකරණ ක්‍රමවේදයක් යොදාගැනීම, ජලය රැස් කිරීම, ජලය කාර්යක්ෂමව භාවිතා කිරීමේ තාක්ෂනයන් යොදාගැනීම හා ජල සම්පත් ආරක්ෂා කරගැනීම කල යුතුය.

03. හරිත වායු විමෝචනය අවම කිරීම හෝ අඩු කිරීම සඳහා සුදුසු යෝග්‍ය කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හඳුන්වාදීම (උදා සූර්ය ජල පොම්ප භාවිතය, කොම්පෝස්ට් පොහොර භාවිතය, ගිනි තැබීම අවම කිරීම හා නිවැරදි පොහොර භාවිතය යනාදී).

04. යෝග්‍ය හා දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් පිළිබද තාක්‍ෂණ කුසලතාවයන් වැඩිකිරීම සඳහා ගොවීන්ට පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා එම තාක්ෂණය අනෙකුත් ගොවීන් සමග හුවමාරු කරගැනීමට අවශ්‍ය කටයුතු සකස් කිරීම.

05. එල්ලංගා පද්ධතියේ ගොවීන් සඳහා අමතර අදායම් මාර්ග හඳුන්වාදීමේ ක්‍රමවේදයන් දේශගුණ සුහුරු කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රියාකාරකම් හරහා හඳුන්වාදීම. (උදා අගය එකතුකළ කෘෂි නිෂ්පාදන, බිම්මල් වගාව, කිරි ආශ්‍රිත නිෂ්පාදන හා ගම් බිත්තර නිෂ්පාදනය යනාදී).

06. වෙළඳපොල ඉලක්ක කරගත් තිරසාරව අඛණ්ඩ දිගුකාලීන අදායම් මාර්ග ලැබෙන කෘෂි බෝග රටාවන් හඳුන්වාදීම. (උදා: අඹ,පොල්, කෙසෙල්, දොඩම්, පේර යනාදී).

07. වී වගා ගොවීන්ගේ කෘෂි ඵලදායිතාව වැඩි කිරීම සඳහා යාන්ත්‍රිකරණය හා පැරෂුට් වී වගා ක්‍රම හඳුන්වාදීම.

08. දේශගුණ සුහුරු කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන් හඳුන්වාදීම හා කෘෂි තාක්ෂණය හඳුන්වාදීම තුලින් කෘෂි ඵලදායිතාව වැඩිකිරීම.

09. කෘමි හා වන සතුන්ගෙන් කෘෂි බෝග ආරක්ෂා කර ගැනීමේ ක්‍රම හඳුන්වාදීම.

10. ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මනාව මෙහෙයවීම හා ඇගයීම සඳහා ක්‍රමවේද හඳුන්වාදීම.

3.9.එල්ලංගාවේ වාරිමාර්ග කලමණාකරනය (Irrigation Management) පිළිබඳ තොරතුරු

එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් 25ක් යටතේ යටතේ වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වී වගා කරන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාව සිදු කරනු ලබයි. මහ කන්නයේද අඛණ්ඩව වගාවන් සිදු නොවන අතර සමහර වැව් වල කන්න ගණනාවක් මහ කන්නයේදී පවා වගා කර නොමැත. විශේෂයෙන්ම ගංගා දෝණියට ලැබෙන ජලය සංවර්ධනය කර තිබෙන වැව් වල ප්‍රමාණයට ප්‍රමාණවත් නොවීම නිසා මහ කන්නයේද වගාව සිදු කිරීමට අපහසු වී ඇත. ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාත්මක වන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත.

එල්ලංගාව සියළු වැව් සාම්ප්‍රදායක වාරි පද්ධතියක තිබිය යුතු අංගයන්ගෙන් බැහැරව ඇත. විශාලතම වැව වන පිදුරුවැල්ලැව වැවද වර්ෂා කාලයට පිටාර ගලයි. සොරොව්වලින් ජලය කාන්දුවේ. වැව් බැම්මට හානි වී ඇත. ප්‍රතිසංස්කරණයෙන් පසුවද වැව්වල අඩුපාඩු රැසක් ඇත. ගොවි ජනතාව ඉල්ලා සිටිනුයේ ප්‍රදේශයේ විශාල ජල ධාරිතාවයක් රඳවා ගත හැකි පිදුරුවැල්ලැව වැව, වලලිය මහවැව, උඩවලලිය වැව යන වැව් තුනවත් අඩුපාඩු නොමැතිව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසය.

විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ කරයි. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. ජලය බෙදා හැරීමේ ගැටළු විසඳීම සඳහා ගොවි සංවිධාන මැදිහත් වේ.

අපවහන ඇළවල් නිසියාකාරව නඩත්තු නොකිරීම සහ බොහෝ අපවහන ඇලවල් ගොවීන් විසින් අල්ලා ගැනීම නිසා නියමිත පරිදි අපවහන ජලය බැස නොයෑම නිසා සමහර කුඹුරු ඉඩම් වල ලවණතාවය ඉහල ගොස් ඇත. වාන වැවේ ප්‍රධාන අංගයකි.ඇතුළු වාන හා පිටවාන යනුවෙන් කොටස් දෙකකි. වැවකට බාහිරින් ජලය සැපයෙන විට එම ඇළ වැවට විවෘත කරන්නේ ඇතුළු වාන මගිනි.වැවේ අතිරික්ත ජලය නිසි ජල කළමණාකරනයකින් යුක්තව වෙනත් වැව්වලට පිට කරනුයේ පිටවාන මගිනි. අතිරික්ත ජලය වාන් ඇල ඔස්සේ වැව්වලට සහ ඇළවේලි වලට පිට කරනු ලබයි.

පිදුරුවැල්ලැව එල්ලංගාවට අයත් වැව් නිරීක්ෂණය කිරීමේදී වාන සහ වාන් ඇල නිසිපරිදි ප්‍රතිසංස්කරනය කල බවක් දක්නට නොලැබුණ අතර බොහෝ වැව්වල ජල ධාරිතාවය පහල ගොස් ඇති බවක් නිරීක්ෂණය විය. ඒසඳහා ප්‍රධානතවම බලපා ඇත්තේ වාන සම්බන්ධ ගැටළුය. ගොවි සමිතිවල නියෝජිතයින් සමග කල අවසන් සාකච්ඡාවේදී ඔවුන් සඳහන් කලේ මහ කන්නයේදී වැව්වල ජල මට්ටම අඩු වු බැවින්,වගා කටයුතු කිරීමට නොහැකි වු බවත්ය. ජල හිගය හේතුවෙන් ගොවි ජනතාව පසුගිය වසර කිහිපය තුළම බෙත්ම ක්‍රමයට වගා කල බව ගොවි සංවිධාන නියෝජිතයින් දන්වන ලදී.
ජල පාලක වරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්නරැස්වීමේ දීය. ඇතැම් ජලපාලකයන් එකදිගට ම කිහිප වරක් පත්වෙන්නේ ගොවීන්ගේ කැමැත්තෙනි. පද්ධතියේ මෙහෙයුමහා නඩත්තුව ගෙවි සංවිධානය මගින් සිදු කරනු ලබන අතර නඩත්තුව ගොවීන් වෙත පංගු ලැස්තුව අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලක වෙත සලාරිස් ලැබියයුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්භ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ වගා කෙරේ .

අඹන්පොල කලාපයට 2020, 2021, 2022 හා 2023 වර්ෂයන් වලදී ලැබු වර්ෂාපතනයන් සැලකිල්ලට ගෙන එල්ලංගාවේ වගා සැලැස්ම සකසා ගැනීමටද හැකිවේ.

වගු අංක10- කලාපයට ලැබෙන වර්ෂාපතනය අගයන් (මිලිමීටර)

මාසය	වර්ෂය			
	2020	2021	2022	2023
ජනවාරි	4.1	80.3	21.4	52.8
පෙබරවාරි	-	-	65.5	140.4
මාර්තු	-	51	23.5	116.3
අප්‍රේල්	127.0	-	63.3	-
මැයි	-	360.4	163.2	97.7
ජූනි	28.6	-	21.5	5.1
ජූලි	151.9	-	157.8	9.2
අගෝස්තු	48.7	-	90.3	9.5
සැප්තැම්බර්	155.2	-	22.6	189.8
ඔක්තෝබර්	45.7	289.7	159.6	223.3
නොවැම්බර්	237.6	368.29	221.0	690.5
දෙසැම්බර්	249.8	-	148.6	252.1

මූලාශ්‍රය -කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

උක්ත වර්ෂාපතන දත්ත අනුව පිදුරුවැල්ලැව එල්ලංගාවේ වර්ෂාපතනය පිළිබඳ නිර්ණය කල හැකිය. ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතන රටාව අනුව හා ඉහත සඳහන් ස්ථාන වල වර්ෂාපතන මානයන්ගේ දත්ත අනුව ජුනි, ජූලි, අගෝස්තු මාස වල ඉතා අවම වර්ෂාපතනයක් පෙන්නුම් කරයි. අප්‍රේල් මාසයේදී වර්ෂාපතනයක් නොලැබෙන බවත් උපරිම වර්ෂාව මිමී 690.5ක් වන්නේ නොවැම්බර් මාසයේදී බවත් පැහැදිලි වේ.

මෙම දත්ත විශ්ලේෂණය එල්ලංගාවට සාමාන්‍ය වැස්සක් ලැබෙන බව කිව හැකිය. මෙම තත්වයන් සැලකිල්ලට ගෙන සුදුසු වගා සැලැස්මක් තීරණය කල යුතුය.
ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය ඉහත වගු ව තුලින් දක්වා ඇත . මෙම සටහන් අනුව එල්ලංගාව ආසන්නයේම වර්ෂාපතනමාන තොරතුරු අනුව මධ්‍යස්ථ වර්ෂාපතනයක් මෙම වසර තුල දක්වා ඇත.
ඇතැම් ගොවීන් තම අභිප්‍රාය අනුව ජලය ලබාගැනීම නිසා විධිමත් ජල පාලනයක් සිදු නොවේ. සියලුම වැව් වල වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින්, ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාත්මක වන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත.

විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ වේ.මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. එහෙත් කන්න රැස්වීමේ නීතිරීති අනුව නඩත්තු කටයුතු ඉටුවන බව නිලධාරින්ගේ මතය වී ඇත. ඇල පද්ධතිය ඉතා අබලන්ය.
මේ නිසා යම් ක්‍රමානුකූල ජල කළමනාකරණයක් සිදු කල නොහැකිය. ඇතැම් ඇලමාර්ගකුණු ඇලට ජලය හරවා කුණු ඇල පුරවා කුඹුරු වලට ජලය හරවා ගැනීමට ගොවීන් කටයුතු කරයි. ඒ අනුව ජල කළමනාකරණයක් පිළිබඳව කථා කිරීමට පෙර පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කලයුතුය.

04. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

පිදුරුවැල්ලැව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 57 ආවරණය වන පරිදි එල්ලංගා කලමණාකරන කමිටු 54ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කලමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනාගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් රණය කිරීම,දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහි දී එල්ලංගාව හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී.

මේවා එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

පිදුරුවැල්ලැව එල්ලංගාවේ පසුගිය 2024.05.16 හා 2024.05.28 දිනයන්හි පැවති හරස්කඩ චාරිකාවේදී මෙන්ම ගොවි සංවිධාන සමග පැවති සාකච්ඡා නිලධාරීන් සමග හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය නිලධාරීන් සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණදෙන ප්‍රධන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණය කරගත හැකිවිය .එල්ලංගා හරස්කඩ චාරිකාවෙන් පසුව 2024.06.10 දින පිදුරුවැල්ලැව වලලිය සමිති ශාලාවේදී පැවති වලංගුතාවය පිළිබඳ රැස්වීමේදී (Validation Meeting දී ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේදී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකිවිය. මෙසේ හදුනාගත් ගැටලු ගොවින් ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේකනය ගොනුකර ඇත.

4.1. එල්ලංගාවේ උග්‍ර ගැටළු ප්‍රමුඛතාවය අනුව

I. කට්ටකඩුව නොමැතිවීම හා කට්ටකඩුවේ ගස් නොමැතිවීම
II. සොරොව්වෙන් ජලය කාන්දුවීම
III. වාන පහතින් පිහිටා තිබීම
IV. වාන් ඇළ නොමැතිවීම හා විධිමත් පරිදි ඉදිනොකිරීම
V. ඇළවේලි පද්ධතිය සකස්කර නොමැතිවීම නිසා වගාවට අවශ්‍ය ජලය ලබාගත නොහැකි වීම
VI. වැව් බැම්ම පුපුරා යාම හා නඩත්තුවක් නොමැතිවීම
VII. පෙරහන (උස්වැටිය) නොමැති වීම
VIII. වැව්වල සීමා මායිම් නොමැතිවීම.
IX. ආක්‍රමණික ජලජ ශාක පැතිරීම

X. පාංශු ඛාදනය හේතුවෙන් වැව්වල රොන්මඩ තැන්පත් වී වැව් ගොඩවීම
XI. ප්‍රතිසංස්කරණයේදී නිසි පරිදි පස්ඉවත් නොකිරීම
XII. අභ්‍යන්තර කෘෂිමාර්ග විධිමත් නොවීම කෘෂි මාර්ග විධිමත් නොවීම
XIII. වැවේ පෝෂක ප්‍රදේශය තුල අනවසර වගා කිරීම්.
XIV. වැවේ පෝෂක ප්‍රදේශය තුල අනවසර වගා කිරීම්.
XV. ගොවි සංවිධාන වල විධිමත් නඩත්තු ක්‍රමයක් නොමැති වීම
XVI. යල හා මහකන්න වගාවන්ට ප්‍රමාණවත් ජලය නොමැතිවීම
XVII. මිරිදිය මත්ස්‍ය වගාව අඩුවීම
XVIII. ගොඩවලක් නොමැති වීම

පිදුරුවැල්ලැව වැව් තාවුල්ලේ ගස් ගිණිතැබීම

හේන් වගාවට ගස් කැපීම

වලලලිය වැවේ බැම්ම ගිලා බැසීම

පාංශු ඛාදන

4.2 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

වගු අංක 11- පිදුරුවැල්ලැව හරස්කඩ චාරිකාවෙන් හදුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම

අනු අංක	උග්‍ර ගැටළු හා ගැටළුව පවතින ස්ථාන	යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්	මැදිහත්වීම
01.	වැව් වල කට්ටකඩුව හා ගස් ගොම්මන නොමැතිවීම. (උඩවලලිය, ඉහල යන්තම්පලගම වැව, ඉහල බෝගහ වැව, පිදුරුවැල්ලැව වැව, ඉහල තංතිරියාව වැව, වදුරැස්ස වැව, වලලිය මහ වැව පහල වල්පාලුව වැව,අඹ වැව, කරුවලගස්වැව, බඩබැද්දැව, දවුල්කාරයාගේ වැව, ඌරා වැව,බෙරු වැව,පහල කුඩා වත්තේ වැව)	i. CMC හිදී සාකච්ජාවට ගැනීම. ii. අවශ්‍ය වැව් තෝරා ගැනීම . iii. ගොවීන් දැනවත් කිරීම. iv. ඒකාබද්ධව කට්ටකඩව වෙන් කිරීම. v. පැල සිටුවීම සඳහා ප්‍රතිපාදන සපසා දීම. vi. අධීක්ෂණය.	i.ගොවි සංවිධාන ii.දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iii.ගොවිජන සේවා දෙපාර්තමේන්තුව iv.පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
02.	සොරොව්වලින්හාපැතිබැම්වලින්ජලයකාන්දුවීම (උඩ වලලිය වැව,වලලිය මහ වැව ජලය කාන්දුවීම හා වාහන ඇතුල් කිරීම සඳහා කොන්ක්‍රීට් ලැල්ලක් නොමැතිවීම කොසැත්තැව වැව, බඩබැද්දැව වැව, හිරියාලේගම වැව, ඉහල යන්තම්පලගම වැව)	i. CMC හිදී සාකච්ජා කිරීම. ii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම. iii. කොන්ත්‍රාත් කරුවන් හා ව්‍යාපෘති නිලධාරීන් සමග සාකච්ජා කිරීම.	i. වැව ප්‍රතිසංස්කරණය කරන ලද කොන්ත්‍රාත්කරු ii. ගොවි සංවිධාන iii. දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

03.	වාන සම්බන්ධ ගැටළු (වාන පහතින් පිහිටා තිබීම පහල බෝගහ වැව, පහල තංතිරියාව වැව, අඹ වැව, උඩ වලලිය, ඉහල යන්තම්පලගම වැව, වදුරුස්ස වැව)	i. CMC යට අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීම. ii. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම. iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම. iv. අවශ්‍ය නම් ප්‍රතිපාදන සපයා ගැනීම. v. කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම. vi. අධීක්ෂණය.	i.වැව ඉදිකල කොන්ත්‍රාත්කරු ii ගොවි සංවිධාන iii.දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iv.පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව v.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
04.	වාන් ඇළ නොමැතිවීම හා විධිමත් පරිදි ඉදි නොකිරීම. (ඉහල බෝගහ වැව, වදුරුස්සගම වැව, පිදුරුවැල්ලැව වැව, බඩ බැද්දැව වැව)	i. CMC යට අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීම. ii. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම iv. ප්‍රතිපාදන සපයා ගැනීම v. කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම vi. අධීක්ෂණය	i.ගොවි සංවිධාන ii.දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iii.ගොවිජන සේවා දෙපාර්තමේන්තුව iv.පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
05.	ඇළවේලි පද්ධතිය සකස්කර නොමැතිවීම නිසා වගාවට අවශ්‍ය ජලය ලබාගත නොහැකි වීම. එල්ලංගාවේ වැව් 25ට අදාළව ඇළවේලි නොමැත. (පළමු අදියර - වලලිය මහ වැව, පිදුරුවැල්ලැව වැව, උඩ වලලිය වැව)	අදියර -01 i. අදියර කිහිපයක් යටතේ ඇළවේලි සම්පාදනය කිරීමට CMC මගින් අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීම. ii. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම iv. ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන සපයා ගැනීම v. කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම vi. අධීක්ෂණය	i ගොවි සංවිධාන ii.දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iii.පළාත්වාරිමාර්ග දෙපාර්තමේන්තුව iv.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව

06.	වැව් බැම්ම පුපුරා යාම වලලිය වැව, පිදුරුවැල්ලෑව වැව කොසැත්තෑව වැව, අඹ වැව	i. CMC හිදී සාකච්ඡා කිරීම . ii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම. iii. කොන්ත්‍රාත්කරුවන් හා ව්‍යාපෘති නිලධාරීන් සමග සාකච්ඡා කිරීම . iv. රඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම	i.වැව ප්‍රතිසංස්කරණය කරන ලද කොන්ත්‍රාත්කරු ii.දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iii.පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව iv.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව
07.	පෙරහන නොමැතිවීම (උඩවලලියවැව, පහල බෝගහවැව, කොසැත්තෑව, අඹ වැව, ඌරා වැව, දවුල්කාරයාගේ වැව)	i. CMC හිදී සාකච්ඡාවට ගැනීම. ii. අවශ්‍ය වැව් තෝරා ගැනීම . iii. ගොවීන් දැනවත් කිරීම. iv. පැල සිටුවීම සඳහා ප්‍රතිපාන සපසා දීම. v. අධීක්ෂණය.	i.ගොවි සමිති ii.දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iii.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
08.	වැව්වල සීමා මායිම් ළකුණු කර නොමැතිවීම.	i. CMC හිදී සාකච්ඡාවට ගැනීම. ii. අත්‍යවශ්‍ය වැව් හඳුනා ගැනීම iii. අවශ්‍යනම් මැනීම් කටයුතු සිදු කිරීම iv. ගොවි සංවිධාන දැනුවත් කිරීම v. ඒකාබද්ධව සීමා ළකුණු කිරීම	i.ගොවි සංවිධාන, ii.ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව iii.පොලීසිය iv.දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය v.මිනින්දෝරු. vi.වන සංරක්ෂන දෙපාර්තමේන්තුව
09.	ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම. ආක්‍රමණික ජලජ ශාක ජපන් ජබර, විල කටු (වලලිය, උඩ වලලිය උඩ බෝගහ වැව, පළුගම, වල් පාලුව, කරුවලගස්වැව)	i. CMC හිදී සාකච්ඡාවට ගැනීම. ii. ඇස්තමේන්ත කිරීම. iii. ජලය අඩුවීමත් සමග නිර්දේශිත කෘමි. නාශකයක් යෙදීම. iv. පවත්වාගෙන යාම.	i.ගොවි සමිති ii.දේශගුණ සුහුරු ව්‍යාපෘතිය iii.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව iv.පරිසර අධිකාරිය

10.	පාංශු ඛාදනය හේතුවෙන් රොන්මඩ ඒකතු වී වැව් ගොඩවීම. (උඩ වලලිය වැව,වදුරුස්සේගම වැව,පහල බෝගහ වැව,ඌරව වැව,අඹ වැව,පහල තංතිරියාව,ඉහල තංතිරියාව,කොසැත්තෑව, වල් පාලුව වැව,පිදුරුවැල්ලෑව වැව)	i. CMC හිදී සාකච්ඡාවට ගැනීම. ii. ස්ථාන හඳුනා ගැනීම. iii. පාංශු ඛාදන වැටි සැලසම් කිරීම. iv. ඇස්තමේන්තු කර අදාල ගොවීන්ට පැවරීම හා ප්‍රගතිය මැන බැලීම . හා උපදෙස් ලබා දීම.	i.ගොවි සමිති ii.දේශගුණ සුහුරු ව්‍යාපෘතිය iii.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව iv.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
11.	ප්‍රතිසංස්කරණයේදී නිසි පරිදි පස්ඉවත් නොකිරීම (උඩ බෝගහ වැව,වදුරුස්සගම වැව පහල බෝගහ වැව,හිරියාලේගම වැව කොසැත්තෑව වැවේ ඇතුලත පස් ගොඩැලි පැවතීම,මිල්ලගහ වැව)	i. CMC හිදී සාකච්ඡා කිරීම ii. කොන්ත්‍රාත්කරුවන් කරුවන් හා ව්‍යාපෘති නිලධාරීන් සමග සාකච්ඡා කිරීම iii. රඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම iv. කොන්ත්‍රාත් කරුවන් මගින් පස් ඉවත් කිරීම	i.ප්‍රතිසංස්කරණය කරන ලද කොන්ත්‍රාත්කරුවන් i.ගොවි සමිති ii.දේශගුණසුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iii.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව iv.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
12.	අභ්‍යන්තර කෘෂිමාර්ග අඹලන් වීම -7KM වාන හරහා පාර ප්‍රතිසංස්කරණය කිරීම. (බුලන වැව)- වදුරුස්ස ග්‍රාම සේවා වසම කොසැත්තෑව කරුණාරත්නගේ නිවස ලග සිට ඌරාගොඩ වෙල්යාය දක්වා මාර්ගය 2 කිලෝ මීටර් බක්මී වැව පාරේ සිට පිදුරුවැල්ලෑව වෙල දක්වා මාර්ගය 400 M වලලිය වෑකන්දේ සිට වලලිය වෙල් යාය දක්වා මාර්ගය250 මීටර් වලලිය වැවේ කෙලවරේ සිට පිදුරුවැල්ලෑව දක්වා මාර්ගය 750 මීටර් පිදුරුවැල්ලෑව වැවට යන මාර්ගයේ සිට වලලිය වෙලට යන මාර්ගය 250 මීටර්	i. CMC යට අදාළ පාර්ශව සමග සාකච්ජා කිරීම. ii. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම iv. ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම v. කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම vi. අධීක්ෂණය	i.ගොවි සංවිධාන ii.දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය iii.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව iv.ප්‍රාදේශීය සභාව

	බක්මී වැව පාරේ සිට පිදුරුවැල්ලැව වැව් වාන දක්වා මාර්ගය 350 මීටර් අඹගම්මන හේරත්බංඩාගේ ගෙදර සිට පිදුරුවැල්ලැව වෙල්යායට යන මාර්ගය 500 මීටර් බක් මී වැව පාරේ සිට උඩවලලිය වෙල දක්වා මාර්ගය කිලෝමීටර් 01 වදුරැස්ස ග්‍රාම නිලධාරි කොට්ටාශයේ කරුවලගස්වැව දෙසට ඇති කෘෂිමාර්ගය 500 මීටර් කරුවලගස්වැව දෙසට ඇති කෘෂි මාර්ගය 600-700 මීටර් බුලන වැව දෙසට ඇති කෘෂි මාර්ගය 800 මීටර්		
13.	වැවේ පෝෂක ප්‍රදේශය තුල අනවසර වගා කිරීම්. (පහල තංතිරියාවවැව, හිරියාල වැව, ඌරා වැව , වදුරැස්ස වැව ,පිදුරුවැල්ලැව, කොසැත්තැව වැව)	i. CMC හිදී සාකච්ජාවට ගැනීම. ii. රක්ෂිත මැන වෙන් කිරීම.	i.ප්‍රාදේශිය ලේකම් ii.දේශගුණ සුහුරු ව්‍යාපෘතිය iii.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව iv.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව v. ගොවි සංවිධාන. vi.වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව viii.මිනිනිදෝරු දෙපාර්තමේන්තුව
14.	වැව් වල විධිමත් නඩත්තු ක්‍රමයක් නොමැති වීම (ඉහල යන්තම්පලගම වැව ,උඩ බෝගහ වැව,ඉහල තන්තිරියාව)	i. වැව් සඳහා නඩත්තු සැලැස්මක් සකස් කිරීම. ii. ගොවි සංවිධාන වල කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම හා ඒපිළිබඳ අධීක්ෂණය.	i.දේශගුණ සුහුරු ව්‍යාපෘතිය ii.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව iii.ගොවි සංවිධාන

		iii. වැව් නඩත්තුව සහ නඩත්තු වියදම් සපයා ගන්නා ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.	
15.	යල කන්නයේ දී වගාවන්ට ප්‍රමාණවත් ජලය නොමැතිවීම හා ගුණාත්මක අතිරේක බෝග බීජ නොමැතිවීම.	i. CMC හිදී සාකච්ජා කිරීම . ii. ප්‍රදේශයට උචිත බෝග හඳුනා ගැනීම iii. ගුණාත්මක තත්ත්වයේ බීජ ලබා ගන්නා ස්ථාන පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා ගොවීන් දැනුවත් කිරීම. iv. සහනදායී පදනම මත ගුණාත්මක තත්ත්වයේ බීජ ලබා දීම. v. දේශගුණ සුහුරු වගා ක්‍රම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම.	i.ජ්ල්ලංගා කලමනාකරන කමිටු සාමාජිකයින් ii.දේශගුණ සුහුරු ව්‍යාපෘතියේ ජල කලමණාකරන අංශය
16.	මිරිදිය මත්ස්‍ය වගාවේ හිඟකම	i. CMC හිදී සාකච්ජා කිරීම. ii. මිරිදිය මත්ස්‍ය වගාව සිදු කළ හැකි වැව් හඳුනා ගැනීම iii. NAQDA ආයතනය සමග සාකච්ඡා කර සුදුසු මතස්‍යන් සහ ප්‍රමාණයන් වැව් වලට මුදා හැරීම. iv. ඒකාබද්ධ මිරිදිය ධීවර කමිටුවක් සකස් කිරීම v. මිරිදිය මත්ස්‍ය කර්මාන්තය පිළිබඳ ගොවි සංවිධාන දැනුවත් කිරීම හා අස්වනු නෙලීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.	i.පළාත් ධීවර අංශය ii.පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය. iii.දේශගුණ සුහුරු ව්‍යාපෘතිය iv.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව v.ගොවි සංවිධාන

17.	වන සතුන්ගෙන් වන හානි අලින්, වල් ඌරන් , මොණරුන් , රිලවුන්.)	i. වගා වැට බෙදාහැරීම සම්බන්ධයෙන් CMC හිදී අදාළ අංශ සමග සාකච්ඡා කිරීම . ii. අවශ්‍ය පියවර ගැනීම හා ගොවීන් දැනුවත් කිරීම.	i.පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය. ii.දේශගුණ සුහුරු ව්‍යාපෘතිය iv.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව v.ගොවි සංවිධාන
18.	ගොඩවලක් නොමැතිවීම. (පිදුරුවැල්ලෑව වැව, උඩ වලලිය, උඩ බෝගහ වැව, වලලිය වැව, හිරියාලේගම, මිල්ලගහ වැව, දවුල්කාරයාගේ වැව)	i. CMC හිදී සාකච්ඡාවට ගැනීම. ii. අත්‍යවශ්‍ය ස්ථාන තෝරාගැනීම iii. ආරක්ෂිත වැටියක් සකස් කිරීම	i.පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය. iii.දේශගුණ සුහුරු ව්‍යාපෘතිය iv.ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව v.ගොවි සංවිධාන

4.3. ක්‍රියාත්මක සැලැස්ම Piduruwella Cascade

වගු අංක 12-ඇස්තමේන්තුගත වියදම - එකතුව -රු.මි.13.15

අනු අංක	ඇස්තමේන්තුගත වියදම / සහ යෝජිත ප්‍රධානක්‍රියාකාරකම්	කාලසීමාව 2024 ඔක්තෝම්බර් සිට 2025 දෙසැම්බර් දක්වා															
		ඇස්තමේන්තු මුදල රු.	ඔක්.	නො.	දෙ	ජන.	පෙ	මා.	අ.	මැ.	ජුනි.	ජුලි	අ	සැ.	ඔ.	නො	දෙ.
01.	වැව් වල කට්ටකඩුව හා ගස් ගොම්මන ප්‍රතිෂ්ඨාපනය කිරීම	1.5															
02.	සොරොව්වලින්හාපැතිබැම්ප්‍රතිසං ස්කරනය කිරීම	0.00															
03.	වාන ඉස්සීම (වාන පහතින් පිහිටා තිබීම)	0.00															
04.	වාන් ඇළ විධිමත් පරිදි ප්‍රතිසංස්කරණය කිරීම	1.00															
05.	ඇළවේලි පද්ධතිය සකස්කර කරවගාවට අවශ්‍ය ජලය ලබාගැනීම.	0.00															
06.	වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම	0.00															
07.	පෙරහන ස්ථාපිත කිරීම	0.6															

08.	වැව්වල සීමා මායිම් ලකුණු කිරීම	1.25															
09.	ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම	0.8															
10.	පාංශු ඛාදනය හේතුවෙන් රොන්මඩ ඒකතු වී වැව් ගොඩවීම.	0.8															
11	ප්‍රතිසංස්කරණයේදි වැව් තුල ගොඩ ගැසු පස් හා වැව් ඉස්මත්තේ ඇති පස් ඉවත්කිරීම	0.00															
12.	පිදුරුවැල්ලැව එල්ලංගාවේ කි මී 07ක අභ්‍යන්තර මාර්ග සංවර්ධනය	3.5															
13.	වැවේ පෝෂක ප්‍රදේශය තුල අනවසර වගා කිරීම්.	0.00															
14.	වැව් වල විධිමත් නඩත්තු ක්‍රමයක් නොමැති වීම	0.2															
15.	යල කන්නයේ දී වගාවන්ට ප්‍රමාණවත් ජලය නොමැතිවීම හා ගුණාත්මක අතිරේක බෝග බීජ නොමැතිවීම.	1.00															
16.	මිරිදිය මත්ස්‍ය වගාවේ හිඟකම	1.5															
17.	වන සතුන්ගෙන් වන හානි	1.00															

18.	ගොඩවලක් නොමැතිවීම. දූරුවැල්ලෑව වැව	0.00															
	එකතුව	13.15															

ඇමුණුම්

පිදුරුවැල්ලෑව වැවට ජලය ගලා ඒන අංශ පහත සඳහන් වගුවේ පරිදි වේ.

අංශය	ජල මාර්ගය
01.	ඉහල හිරියාලේගම වැවෙන් ගලා ඒන ජලයට පහල හිරියාලේගම සහ මීල්ල ගහ වැව යන වැව් දෙකේම ජලය ඒක්රැස් වී කොරකහ වැවට වැටෙන අතර ඒම ජලය නැවත ඇළ මාර්ගයක් ඔස්සේ පිදුරුවැල්ලෑව වැවට ගලා බසී.
02.	ඉහල යන්තම්පලගම වැවේ ජලය පහල යන්තම්පලගම වැවට වැටෙන අතර ඒම වැව්වල ජලය උඩ වලලිය වැවට වැටෙන අතර වත්තේ වැව, කරුවල ගස් වැව යන වැව් දෙකේ ජලය ඒකතු වී උඩ වලලිය වැවට පැමිණෙන අතර ඒම ජලය වලලිය වැවට වැටි නතර වී වැවට උතුරෙන් පිහිටි ඉහල බෝගහ වැව පහල බෝගහ වැව යන වැව් දෙකේම ජලය ඒක්රැස් වී වලලිය වැවට වැටෙනඅතර වදුරැස්ස වැවේ ජලය පහල කුඩා වත්ත වැවට වැටී ප්‍රදේශ තුනෙහිම ජලය ඒක්රැස් වී සියළු වතුර පිදුරුවැල්ලෑව වැවට වැටේ.
03.	බූලන වැව තුළින් ගලා ඒන ජලයට (මී ගහ වැව හා පාලුගම යන වැව් දෙකේම ජලය ඒකතු වන අතර පන්සලේ වැවේ ජලය හා වල් පාලුව වැවේ වතුර ඒකතු වී පිදුරුවැල්ලෑව වැවට වැටේ. ඉහලබඩ බැද්දෑව හා පහල බඩ බැද්දෑව වතුර ඒකතු වී ටික දුරක් යන විට කොස්හින්න වැවට ඒකතු වී පිදුරුවැල්ලෑව වැවට වැටේ.
04.	අඹ වැවේ ජලය පිදුරුවැල්ලෑව වැවට වැටේ.

වලලිය ග්‍රාම නිලධාරි කොට්ටාශයේ පැරකුම් ගොවි සංවිධානයේ භාන්ඩාගාරික

සෙනෙවිරත්න

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/3/9/CMC/2023 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023.08.03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>
<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාර්ග (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක විශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ විවිධ ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් පිරිමසමින් ජලය කළමනාකරණය කිරීම.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා ප්‍රධාන පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මූළ පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xxvii. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශිය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරි
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

සැ:යු :- ***එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

3.5. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

3.6. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටුවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමානාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

ඇමුණුම් අංක 03

හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය

1. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
7. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව -කුරුණෑගල
8. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය
9. ගොවි සංවිධානය-වලලිය
10. ගොවි සංවිධානය-වදුරැස්ස
11. ගොවි සංවිධානයබොර වැව

ඇමුණුම් අංක 03

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සහ එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා සහභාගී වූ ආයතන වල ලේඛණය

2. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

4. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

6. දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය,කුරුණෑගල

7. ගොවි සංවිධානය

8. ගොවි සංවිධානය

9. ගොවි සංවිධානය